ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

இலங்கை கைப்பணிப் பொருட்கள் சபை

Sri Lanka Handicrafts Board

LAKSALA

State Gift & Souvenir Boutique











2020

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

Annual Report



වාර්ෂික වාර්තාව 2020

ලක්සල

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

පටුන

ආයතනික තොරතුරු	01
ලක්සල ප්‍රදර්ශනාගාර ජාලය	02
දැක්ම සහ මෙහෙවර	03
කාර්යය සමාලෝචනය සහ මෙහෙයුම් සමාලෝචනය	04 - 10
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්	11
ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම	12

මූල්‍ය වාර්තා

විස්තීර ආදායම් ප්‍රකාශය	15
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	16
කොටස් හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	17
මුල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	18
මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	19 - 37
විගණකාධිපති වාර්තාව	38 - 50

ආයතනික තොරතුරු

ආයතනයේ නම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

ව්‍යවස්ථාපිත ස්වභාවය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පණත යටතේ

ප්‍රධාන කාර්යාලය

අංක : 215, බෞද්ධාලෝක මාවත, කොළඹ 7

දුරකථන : 011 2557132 / 011 2055501

ෆැක්ස් : 011 2594872

අලෙවි විමසීම්

ඊ-මේල් : info@laksala.gov.lk

වෙබ් අඩවිය : *www.laksala.gov.lk*

අලෙවි තොරතුරු

දුරකථන : 011 2597797
ඊ-මේල් : info@laksala.gov.lk

විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකු

ලංකා බැංකුව

මහජන බැංකුව

ලක්සල ප්‍රදර්ශණාගාර ජාලය

1.කොටුව	අංක. 60, යෝක් වීදිය, කොළඹ 01.	011-2323514
2.තුම්මුල්ල	අංක.215, බෞද්ධාලෝක මාවත,තුම්මුල්ල, කොළඹ 07.	011-2580579
3.නුවර	අංක.05, සංඝරාජ මාවත, නුවර.	081-2222087
4.කටුබැද්ද	අංක.282, ගාලු පාර, කටුබැද්ද මොරටුව.	011-2605600
5.ජාතික කෞතුකාගාරය	ලක්සල, කෞතුකාගාර පරිශ්‍රය, කොළඹ 07.	011-2698263
6.බත්තරමුල්ල	අපේ ගම, පැලවත්ත, බත්තරමුල්ල.	011-2786026
7.වැලිපැන්න I	දක්ෂිණ අධිවේගී මාර්ගය,විරාම මන්දිරය සේවා පෙදෙස ‘‘බී’’, ඒ5 සහ ඒ6, වලගෙදර වැලිපැන්න.	034-2241607/8
8. ගාල්ල	අංක.74/1, සමුද්‍ර මාවත, ගාල්ල.	091-2222783
9.පින්නවල	අලි අනාථාගාරය, පින්නවල.	035-2265015
10.පේරාදෙණිය	අංක.14, උද්භිද උද්‍යානය, පේරාදෙණිය.	081-2389253/63
11.කටුනායක	54 ඩී, සංක්‍රමණික වෙන්ව යාමේ කලාපය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, ,කටුනායක.	011-2260167
12.නුවරඑළිය	අංක. 79 පරණ උඩුපුස්සැල්ලාව පාර, නුවරඑළිය.	052-2234445

අපේ දැක්ම

ශ්‍රී ලංකාවේ ත්‍යාග සහ සමරු භාණ්ඩ වෙළඳපල ප්‍රමුඛයා බවට පත්වීම.

අපේ මෙහෙවර

ත්‍යාග සහ සමරු භාණ්ඩ ක්ෂේත්‍රය තුළ වර්ධනීය අවස්ථා පුළුල් කරමින් සහ සංචාරක කර්මාන්තයට උසස් වටිනාකම් එකතු කළ දායකත්වයක් සපයමින් ග්‍රාමීය නිපැයුම්කරුවන්හට පුළුල් වෙළඳපල අවස්ථා විවර කරමින් සමාජ වගකීම ඉටුකරන වාණිජ වශයෙන් සඵලදායී ආයතනයක් බවට පත්වීම

.

අපේ කේන්ද්‍රීය වටිනාකම්

- තත්වය, විශ්වසනීයත්වය සහ මුදලට වටිනාකම.
- විවිධවූ මානයන්ගෙන් යුක්තව හොඳම පාරිභෝගික තේරීම උදෙසා අවස්ථා සම්පාදනය.
- ග්‍රාමීය ප්‍රජාව අතර වටිනාකම් නිර්මාණය සහ වටිනාකම් හුවමාරුව.
- පාරිභෝගිකයා උපරිම ලෙස තෘප්තිමත් කිරීම.

තිරසර සංවර්ධන ඉලක්ක


- 2030 වසර වනවිට දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලට ගනු ලබන නිපැයුම් ප්‍රමාණය දෙගුණ කරමින් දේශීය නිර්මාණ ප්‍රවර්ධනය.
- 2030 වසර වනවිට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කරගැනීමේ අරමුණින් ලක්සල භාණ්ඩ සපයන කාන්තා සැපයුම්කරුවන්ගේ මුළු සංඛ්‍යාව 50% කින් වර්ධනය කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ප්‍රජාව දිරිගැන්වීම පිණිස 2030 වසර වනවිට විශේෂ අවශ්‍යතා ඇති සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව 25% කින් වර්ධනය කිරීම.




දේශීය අත්කම් නිපැයුම්කරුවන් හට දේශීය මෙන්ම විදේශීය වෙළඳපල අවස්ථා විවර කිරීමේ අරමුණින් 1964 වසරේදී ලක්සල ආයතනය ස්ථාපිත කරන ලද අතර 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පණත යටතේ ශ්‍රී ලංකා හස්තකර්මාන්ත මණ්ඩලය වශයෙන් එය සංස්ථාපිත කරන ලදී. මෙකී ක්ෂේත්‍රය තුළ මේවන විට ලක්සල රජය සතු පැරණිතම සහ විශාලතම ජාලය බවට පත්ව තිබේ.

මූල්‍ය කාර්යසාධන සාරාංශය

2020 සමාලෝචන වර්ෂය තුළ ලක්සල මුළු පිරිවැටුම රුපියල් 194,740,004.00 ක් වාර්තා කර ඇති අතර එහි විකුණුම් පිරිවැය රුපියල් 85,307,833.00 කි. පහත ප්‍රස්ථාරයෙන් දැක්වෙන්නේ පසුගිය වසර පහ තුළ ලක්සල සමස්ත විකුණුම්වල සාරාංශයයි.




2020 වර්ෂය තුළ විකුණුම් විශ්ලේෂණයේදී තුම්මුල්ල ප්‍රදර්ශනාගාරය රුපියල් 79,691,725.00 ක් වූ අලෙවියක් සිදු කර විකිණුම් සඳහා ප්‍රධාන දායකත්වය ලබා දී ඇති අතර ගාලු ප්‍රදර්ශනාගාරය ප්‍රදර්ශනාගාර රුපියල් 19,402,867 ක පිරිවැටුමක් සමඟ ඊළඟ ප්‍රධානතම දායකත්වය ලබා දී ඇත.




මිලදී ගැනීම් විශ්ලේෂණය

2020 වර්ෂය තුළ ලක්සල විසින් රුපියල් 77,428,649.00 ක වටිනාකමකට වෙළඳ මිලදී ගැනීම් සිදු කර ඇත. පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරන්නේ පසුගිය වසර පහ තුළ වෙළඳ මිලදී ගැනීමේ ප්‍රවණතාවයයි.



පහත ප්‍රස්ථාරයෙන් අයිතම වර්ගීකරණයට අනුව 2020 වර්ෂයට අදාළ මිලදී ගැනීම් තවදුරටත් නිරූපණය කෙරේ. 2020 වෙළඳ මිලදී ගැනීම් විශ්ලේෂණය කිරීමේදී, වෙළඳ මිලදී ගැනීම්වලින් ඉහළ ප්‍රතිශතයක් කලා සහ අත්කම් අංශයෙන් නියෝජනය වේ.





වියදම් විශ්ලේෂණය

2020 වර්ෂය තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් දිවයින පුරා පනවන ලද අගුලු දැමීම් හේතුවෙන්, මුළු වියදම රුපියල් මිලියන 243 දක්වා සීමා වී ඇති අතර එය පෙර වසර හා සසඳන විට 42% ක පහත වැටීමකි.

වියදම්	2019	2020
පරිපාලන වියදම්	292,262,229	188,621,582
බෙදා හැරීමේ වියදම්	53,802,840	17,834,739
මූල්‍ය පිරිවැය	74,588,320	37,004,985
බදු	-	-
	420,653,389	***243,461,306***

පහත ප්‍රස්ථාර මගින් පෙර වසර හා සැසඳීමේ දී මුළු වියදම්වල සංයුතිය දක්වයි.





කාර්ය සාධන සමාලෝචනය - 2020 වර්ෂය

පසුබිම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල 2020 වර්ෂයේ කාර්ය සාධන සමාලෝචනය සතුටින් ඉදිරිපත් කරමි. දේශීය හස්තකර්මාන්ත නිර්මාණකරුවන්ට දෙස් විදෙස් වෙළඳපල අවස්ථා ඇති කරලීමේ අරමුණ පෙරදැරිව ලක්සල ආයතනය 1964 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව අනුබද්ධ ආයතන පනත යටතේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වශයෙන් ස්ථාපිත කොට ඇත. ලක්සල මෙම ක්ෂේත්‍රයේ රජය සතු පැරණි සහ විශාලතම අලෙවි ජාලය බවට මේ වන විට පත්ව ඇත.

උපාය මාර්ගික ප්‍රවේශය,

ආරම්භ කරන ලද ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන් තුළින් තම පිරිවැටුම හා ලාභදායීත්වය මෙන්ම තිරසාර පැවැත්මක් සඳහා අත්‍යාවශ්‍ය, පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කරගත් අතර අවශ්‍යතාවයන්ට සහ ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍ය කටයුතු කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ගයන් තවදුරටත් ශක්තිමත් කරන ලදී. එනම්,

- තම අලෙවිකරණ භාණ්ඩ කාණ්ඩ පුළුල් කරමින් නව වෙළඳපලක් ලබාගැනීම (Category Expansion).
- සන්නාමකරණය (Branding) තුලින් ආයතනයේ නාමය වෙළඳපළ තුළ ස්ථාපනය කිරීම.
- සංග්‍රහශීලී පාරිභෝගික සේවයකට අවශ්‍ය ආකාරයට සේවක මණ්ඩලය තුළ යහපත් ආකල්ප හා කුසලතා ගොඩනැංවීම.
- අන්තර්ජාලය හරහා ලක්සල භාණ්ඩ මිලදී ගැනීමේ පහසුකම් තව දුරටත් වර්ධනය කිරීම. (Online sales Facilities)
- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය වැනි ආයතන හා පෞද්ගලි සංචාරක ආයතන සමඟ නිරතුරුව සම්බන්ධතා පවත්වා ගෙනයමින් ලක්සල ප්‍රදර්ශනාගාර සඳහා විදේශීය සංචාරකයින් ගෙන්වා ගැනීමේ කටයුතු සංවිධානය කිරීම.

ලක්සල වෙළඳනාමය යටතේ හඳුන්වා දෙන ලද ලක්සල ප්‍රදර්ශනාගාර තුල අලෙවි කරනු ලබන සියලුම භාණ්ඩ පෙළ තවදුරටත් පුළුල් කරන අතර ඒවා ගුණාත්මක හා උසස් තත්වයේ නැගි හා සමරු භාණ්ඩ ලෙසින් දෙස් විදෙස් පාරිභෝගිකයන්ට පහසුවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු තවදුරටත් පුළුල් කරනු ඇත. ඒ අනුව ඉතා උසස් තත්වයේ නවීන විලාසිතා වලින් අනූන භාණ්ඩ රාශියක් අලෙවිය සඳහා ප්‍රදර්ශනය කරන අතර ලක්සල ශ්‍රී ලංකාවේ නැගි හා සමරු භාණ්ඩ අලෙවිකරණයේ එකම රාජ්‍ය හා ප්‍රධාන වාණිජ ආයතනයක් බවට දෙස් විදෙස් පාරිභෝගිකයන්ගේ හදවත් තුළ රඳවා තබා ගැනීමට අවශ්‍ය අලෙවිකරණ කටයුතු පුළුල් කොට පාරිභෝගිකයින් ආයතනය කරා තව තවත් ආකර්ෂණය කර ගැනීම හා රඳවා තබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

සන්නම් කරණය තුලින් ආයතනයේ නාමය වෙළඳපල තුළ ස්ථාපනය කිරීම

ලක්සල තම අලෙවි ප්‍රදර්ශනාගාර වර්තමාන වෙළඳපොළට සරිලන ආකාරයෙන් ඉතා උසස් මට්ටමකට පත් කරන ලදී. ඒ අනුව ලක්සල ප්‍රදර්ශනාගාර නවීකරණය කර දෙස් විදෙස් පාරිභෝගික ආකර්ශනය ඇතිවන පරිදි ඉතා ඉහළ මට්ටමකට පත් කිරීම මෙන්ම ලක්සල වෙළඳ නාමය යටතේ නිෂ්පාදන හඳුන්වා දෙමින් භාණ්ඩ ප්‍රදර්ශනය ඉහළ මට්ටමක පවත්වාගැනීම හා සන්නාමකරණය තුලින් අපේක්ෂිත අලෙවි ඉලක්ක සපුරා ගැනීමටද කටයුතු කරන ලදී.

<u>සංග්‍රහශීලී පාරිභෝගික සේවාවකට අවශ්‍ය වන පරිදි සේවක මණ්ඩලය තුළ යහපත් ආකල්ප ගොඩනැංවීම.</u>

පාරිභෝගික අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුන් හට සංග්‍රහශීලි සේවයන් ලබා දීම සඳහා නව වෙළඳපොළට සරිලන ආකාරයට කටයුතු කළ හැකි සේවක මඩුල්ලක් පවත්වා ගැනීමට කටයුතු කිරීම සහ අවශ්‍ය නිසි පුහුණුව මෙන්ම පෙළඹවීම ඇති කිරීම තුළ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. ඒ අනුව වැටුප් හා දීමනා ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව මත සිදුකිරීම තුලින් ඔවුන්ගේ උනන්දුව වර්ධනය කිරීම, තවදුරටත් ආයතනයේ මූලික අරමුණු ඉටුකර ගැනීමට බොහෝ දුරට උපකාරී වී ඇත.

නිෂ්පාදන අයිතමයන් පුළුල් කිරීම

නව උපාය මාර්ගික වැඩ පිළිවෙළ යටතේ ආයතනයේ කාර්යයන් පමණක් නොව තම වෙළඳ භාණ්ඩ කාණ්ඩයන්ද පුළුල් කිරීම සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ජාතික ශිල්ප සභාව සහ අනෙකුත් අදාල රාජ්‍ය ආයතන සමඟ එක්ව අවශ්‍යය පියවර ගන්නා ලදී. දේශීය නිෂ්පාදනවල අනන්‍යතාවය රැකගනිමින් වර්තමාන වෙළඳපළ අවශ්‍යතා සඳහා නව නිර්මණ ඉතා උසස් තත්වයෙන් යුතුව නිර්මාණය කොට වෙළඳපළට හඳුන්වා දීම හා මෙම තෑගි සහ සමරු භාණ්ඩ කාණ්ඩයන්ට මැණික් සහ ස්වර්ණාභරණ, තේ, කුළු බඩු, සම් භාණ්ඩ, පිගන් භාණ්ඩ මෙන්ම දේශීය වෙස් මුහුණු සහ අනෙකුත් සමරු නිර්මාණ හඳුන්වා දුන් අතර ලක්සල නව නිර්මාණ අංශය විසින් ද නව අත්කම් නිපැයුම් හඳුන්වා දීම තුලින් තෑගි හා සමරු භාණ්ඩ ක්ෂේත්‍රයේ නව නිර්මාණ රාශියක් එළි දැක්වීමට කටයුතු කරන ලදි.

සැපයුම් ජාලය

ලක්සල සැපයුම් ජාලය මගින් ප්‍රදර්ශනාගාරවල අලෙවි කිරීමට අවශ්‍ය තෑගි හා සමරු භාණ්ඩ මිලදී ගැනීම මෙන්ම එම භාණ්ඩ නිෂ්පාදනය සැලසුම් කිරීම් තත්ව පාලනය හා නවීන මෝස්තර ලබා දීම ද ඇතුළත් වේ. 2020 වර්ෂයේ අවසන් වන විට ක්‍රියාකාරී සැපයුම්කරුවන් සංඛ්‍යාව 505 ක් පමණ වූ සමස්ත දේශීය හස්ත කර්මාන්ත ශිල්පීන් සංඛ්‍යාව මෙම වසර තුළ තවදුරටත් වර්ධනය වී ඇති අතර නව වෙළඳපළ අවස්ථා වැඩි දියුණු කිරීම තුළින් නව නිෂ්පාදකයින් හට මෙම ක්ෂේත්‍රය තුළට පිවිසීමට අවස්ථාවන් පුළුල් කරන ලදි.

පරිපාලනය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල සමස්ථ මෙහෙයුම් කටයුතු වලට අදාල අණපනත් , රාජ්‍ය චක්‍රලේඛ හා අනෙකුත් මූල්‍ය හා පරිපාලන උපදෙස් වලට අනුකූලව ක්‍රියාත්මක කරන ලද අතර යහපාලන හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව කටයුතු කිරීමටද තහවුරු කරන ලදි.සංවිධානයේ ඉලක්ක හා පරමාර්ථ ලගාකර ගැනීම උදෙසා මෙන්ම අනෙකුත් සහායක සේවාවන් සැපයීම පිනිස පරිපාලන සහ මානව සම්පත් අංශය සැලකිය යුතු කාර්යභාර්යයක් ඉටුකරන ලදී.අදාල සමාලෝචනිත වර්ෂය තුල කාර්යය මණ්ඩලය අදාල සමාලෝචිත වර්ෂය තුල කාර්ය මණ්ඩලය 123කින් සමන්විත වන අතර එහි විස්තර පහත සඳහන් වේ.

2020/12/31 දිනට සමස්ථ කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මට්ටම	08	
ද්විතික මට්ටම	08	
තෘතික මට්ටම	56	
ප්‍රාථමික මට්ටම	09	81
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය	42	
මුළු ගණන		123

පෙර වසර සමඟ සසඳා බැලීමේදී සමාලෝචිත වර්ෂය තුල කාර්ය මණ්ඩල තත්ත්වය 129 සිට 123 දක්වා අඩු වී ඇත. තරඟකාරී අලෙවි පරිසරය තුළ මනාලෙස සකසන ලද කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන ව්‍යාපාර සැලැසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා වන ප්‍රයත්නයේදී මනා ලෙස පුහුණුව ලද, කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ගොඩනැංවීම යන්න තීරක කාර්යභාරයක් ඉටු කරයි.

අලෙවි කාර්ය මණ්ඩලය මෙන්ම සහාය කාර්ය මණ්ඩලය වෙත ආකර්ශණීය දිරිදීමනා ක්‍රමයක් හඳුන්වාදෙමින් සහ ඔවුන්ගට පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සේවකයින්ගේ ගුණාත්මක භාවය සහ ඵලදායකත්වය වර්ධනය කිරීමට පියවර ගණු ලැබිණි.මීට අමතරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ආයතනයේ මෙහෙයුම් කටයුතු වලට සරිලන පරිදි නව සේවක සංඛ්‍යාවක් අනුමත කර ගැනීමට ඉල්ලුම් කොට ඇත.

2020 වර්ෂයේ මුල සිට පැතිර ගිය කොවිඩ් 19 ගෝලීය වසංගත තත්වය හා සංචරණ සීමා පැනවීම හේතුවෙන් දිවයිනට පැමිණෙන විදේශීය සංචාරකයින් හා දේශීය පාර්භෝගිකයින් බොහෝ සෙයින් අඩුවූ අතර ඒ හේතුවෙන් සැලසුම්කර තිබූ අලෙවි ඉලක්ක සපුරාගැනීමට අපහසුවූ නිසා අපේක්ෂිත අලෙවි අදායම උත්පාදනය කර ගැනීමට නොහැකි විය.

එහෙත් 2021 වසරේදී විදේශීය සංචාරකයින්ගේ පැමිණීම යථාවත් වනු ඇතැයි අපේක්ෂා කරන හෙයින් නව සැලැස්මක් යටතේ අලෙවි සහ විකුණුම් තවදුරටත් වර්ධනය කිරීමට අවශ්‍ය සියලුම උපාය උපක්‍රම ක්‍රියාත්මක කරමින් ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

අංකය	අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන්ගේ නම්	පත්වීම් කාල සීමාව	
		සිට	දක්වා
01	ජී.ඩී.එස්.පී කුමාර මයා	29.08.2018	24.01.2020
02	ආචාර්ය එම්.එච්.එම් වසීර් මයා	10.08.2018	03.01.2020
03	එම්. නයනාවන්ද්‍ර මයා	10.08.2018	03.01.2020
04	ඒ.ඒ.ඒ රුවායිස් මයා	18.10.2018	03.01.2020
05	එච්.එම් මෙහොමඩ් රුවායිත් මයා	19.10.2018	03.01.2020
06	අයි.පේ අබේරත්න මිය	30.04.2019	09.10.2020
07	සුජීව එස්. පල්ලියගුරුගේ මයා *	31.12.2019	30.09.2020
08	ජී.පී.එස්.එස් වීරසූරිය මයා	03.01.2020	30.09.2020
09	සජිත් එම්. කොඩිකාර මයා	03.01.2020	02.05.2023
10	මධුමාලී අල්විස් මිය (නීතීඥ)	03.01.2020	02.05.2023
11	කේ.එල් මහින්ද සමරතුංග මයා	03.01.2020	09.01.2023
12	එන්.ජී.ඒ.ආර් ජයවර්ධන මිය	24.01.2020	02.03.2022
13	පේ. ක්‍රිෂ්ණමූර්ති මිය	24.01.2020	09.10.2020
14	ඩී. ජීවානාදන් මයා	09.10.2020	වත්මන්
15	ප්‍රදීප් ගුණවර්ධන මයා *	12.10.2020	07.05.2021
16	ලක්මල් වික්‍රමආරච්චි මයා * (නීතීඥ)	11.11.2020	23.12.2022

* අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස මෙන්ම ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල සභාපති ලෙස කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම

මධුර ද සිල්වා මහතා	අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක
සී.එන්.දහනායක මහතා	අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන)
කේ.පී.පී.එස් කේ. පතිරණ මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක
කේ.සී.ජයවර්ධන මහතා	අධ්‍යක්ෂ (විකුණුම්)
ඊ.ඇලන් ඩෙලිල්කන් මහතා	වැඩ බලන අධ්‍යක්ෂ (මුදල්)
සම්පත් සෙනෙවිරත්න මහතා	වැ.බ අධ්‍යක්ෂ (සැපයුම් ජාල සංවර්ධන)
වජිරා සමරරත්න මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
දේවිකා කුමාරි අතුකෝරළ මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (බෙදාහැරීම්)
ඒ.එල්.එම් රිස්වාන් මහතා	සහකාර අධ්‍යක්ෂ (ආදායම් හා වියදම්)
ගයාන් ලියනගේ මහතා	වැ.බ සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන)
දිනේෂ් අබේකෝන් මහතා	තොරතුරු තාක්ෂණ ඒකක ප්‍රධානී

අපේ කෘතඥතාව

පළමුව මම ලක්සල වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා සහ නියෝජ්‍ය අමාත්‍යතුමා හට මහත් කෘතවේදීත්වය පුදදෙනු කැමැත්තෙමි. අප ආයතනය ක්ෂේත්‍රයෙහි ඉහලම ස්ථානයකට නංවාලනු පිණිස නිරතුරු ඇවැසි තීරණ සහ නිගමනයන් ලබාදීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් අවශ්‍ය තීන්දු තීරණ ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්හටද කෘතවේදීත්වය පුදනු කැමැත්තෙමි.

තවද, අවශ්‍ය සෑම අවස්ථාවකම අප ආයතනයේ ප්‍රගතිය උදෙසා ලබාදුන් සහය වෙනුවෙන් මම අප අමාත්‍යාංශයේ ලේකම්තුමාට කෘතවේදීත්වය පළ කර සිටිමි.

එමෙන්ම ආයතනයේ පරිපාලන, මූල්‍ය සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඵලදායීව තම සේවක මණ්ඩලය මෙහෙයවූ අංශ ප්‍රධානීන්ට මෙන්ම ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාමට දායකත්වය ලබාදෙන ලද අනෙකුත් සමස්ථ කාර්ය මණ්ඩලය වෙතද මාගේ ස්තුතිය පුද කරමි.

අප සමග අත්වැල් බැඳගනිමින් පාරිභෝගික අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන, නව නිපැයුම් හඳුන්වා දෙමින්, සම්ප්‍රදායික මෙන්ම නව්‍ය වූ නිපැයුම් ඇතුළුව අත්කම් සහ සමරු භාණ්ඩ සපයමින් අප හා එක්වූ නිපැයුම්කරුවන්ට මෙහිදී විශේෂ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි. එසේම සෑම අවස්ථාවකම අප ආයතනය මත විශ්වාසය රැඳවූ දේශීය මෙන්ම විදේශීය ගණුදෙනුකරුවෝද අපේ විශේෂ ස්තුතියට හිමිකම් ලබති.

2020 වර්ෂයේ මුල සිට පැතිර ගිය කොවිඩ් 19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් රට වසා දැමීමත් සංචරණ සීමා පැනවීමත් නිසා දේශීය හා විදේශීය සංචාරකයින් නොපැමිනීම නිසා ආයතනයේ අලෙවි ආදායම සීඝ්‍රයෙන් පහළ වැටීම සිදුවිය. එම නිසා අපේක්ෂිත අලෙවි ඉලක්ක කරා යාමට මෙම වසරේ නොහැකිවූ නමුත් 2021 වසර තුළ අලෙවි සහ විකුණුම් තවදුරටත් වර්ධනය කිරීම උදෙසා අවශ්‍ය වන විශේෂඥ සේවා ලබාගනිමින් ආයතනයේ අලෙවිය පුළුල් කිරීමට මම අපේක්ෂා කරමි.

අනාගතයේදී ශ්‍රී ලාංකික ග්‍රාමීය ආර්ථිකය සවිමත් කිරීමට සහ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වයන් නගා සිටුවීමට ඇවැසි සියළු පියවර අප ආයතනය මගින් ගනු ලබන බව ප්‍රකාශ කරන අතරම ඉදිරි වසරවලදී අපගේ අලෙවිය රුපියල් බිලියනයක් දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරන බවද අවසන් වශයෙන් පවසමි.

තවද, ආයතනයේ මානව සම්පත මෙන්ම භෞතික සම්පත්ද ක්‍රමිකව කළමණාකරනය කිරීම හරහා සමස්ත කාර්ය මණ්ඩලයෙන්ම කාර්යක්ෂම සහ සඵලදායී දායකත්වය ලබාගනු පිණිස සකසන ලද උපායමාර්ගික සැලසුමකට අනුව ආයතනයේ පොදු කාර්ය පිරිවැය සැලකිය යුතු මට්ටමකින් පහත හෙලමින් 2021 වසර තුළ අපගේ ලාභ ප්‍රතිශතය වර්ධනය වන තත්වයක පවත්වා ගැනීමටද සැලසුම් සකස් කර ඇත.

සභාපති,

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන

2020 දෙසැම්බර් **31**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් **31** න් අවසන් වසර සඳහා

	සටහන්	2020 රු.	2019 රු.
ආදායම	**3**	194,740,004	617,296,345
විකුණුම් මිල		(85,307,833)	(258,401,407)
දළ ලාභය		**109,432,171**	**358,894,938**
ලැබී ඇති ආධාර		21,466,252	150,000,000
වෙනත් ආදායම්	**4**	6,818,812	10,806,240
පරිපාලන වියදම්	**5**	(188,621,582)	(292,262,229)
බෙදා හැරීමේ වියදම්	**6**	(17,834,739)	(53,802,840)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ප්‍රතිඵල		**(68,739,086)**	**173,636,109**
මූල්‍ය පිරිවැය	**7**	(37,004,985)	(74,588,320)
බදුවලට පෙර ලාභය		**(105,744,071)**	**99,047,789**
බදු	**8**	-	-
වර්ෂය සඳහා ලාභය		**(105,744,071)**	**99,047,789**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියන සහ උපකරණ	09	**897,120,392**	947,265,898
මුළු ජංගම නොවන වත්කම්		**897,120,392**	**947,265,898**
ජංගම වත්කම්			
භාණ්ඩ වට්ටෝරු	10	**619,209,585**	637,430,580
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	11	**71,085,017**	86,360,169
මුදල් සහ මුදලට සමාන දෑ	12	**28,002,906**	28,929,936
මුළු ජංගම වත්කම්		**718,297,508**	**752,720,685**
මුළු වත්කම්		**1,615,417,900**	**1,699,986,583**
හිමිකම් සහ බැඳීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		**69,628,878**	69,628,878
ප්‍රාග්ධන සංචිත		**510,806**	510,806
ප්‍රත්‍යාගණන සංචිත		**454,366,157**	454,366,157
ප්‍රාග්ධන දීමනා		**107,951,172**	107,951,172
රඳවාගත් ඉපැයුම්		**(125,845,784)**	(18,714,487)
සම්පූර්ණ හිමිකම්		**506,611,229**	**613,742,527**
ජංගම නොවන බැඳීම්			
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	13	**56,203,979**	50,896,038
විලම්බිත ආදායම	14	**49,504,712**	74,844,712
දිගු කාලීන ණය ගැනීම්	15	**385,279,409**	388,650,929
මුළු ජංගම නොවන බැඳීම්		**490,988,100**	**514,391,679**
ජංගම බැඳීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවීම්	16	**522,556,559**	496,996,396
ගෙවිය යුතු ආදායම් බදු	8	**20,811,536**	25,459,280
කෙටි කාලීන ණය ගැනීම්	17	**69,096,784**	43,076,000
බැංකු අයිරා	18	**5,353,692**	6,320,701
මුළු ජංගම බැඳීම්		**617,818,571**	**571,852,377**
මුළු බැඳීම්		**1,108,806,671**	**1,086,244,056**
මුළු හිමිකම් සහ බැඳීම්		**1,615,417,900**	**1,699,986,583**

ඊ ඒ ඩෙලිල්කන් මහතා
මූල්‍ය අධ්‍යක්ෂ (වැඩ බලන)

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් 24/01/2022 දින නුමිමුල්ල ලක්සලේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අත්සන් කරන ලදී.

එස්.එම්.කොඩිකාර මහතා	එන්.පී.ඒ.ආර්.ජයවර්ධන මිය	ලක්මාල් වික්‍රමආරච්චි මහතා
මණ්ඩල සාමාජික	**මණ්ඩල සාමාජික**	**සභාපති**

පිටු 9 සිට 28 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. වරහන් වල ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	නැවත තක්සේරු කිරීමේ සංචිත	ප්‍රාග්ධන ප්‍රදාන	රඳවා ගත් ඉපැයීම්	මුළු හිමිකම්
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2019 ජනවාරි 1 වන දිනට ශේෂය	69,628,878	510,806	454,366,157	107,951,172	(172,251,065)	**460,205,948**
පෙර වසරේ දෝෂ වලට ගැලපීම්	-	-	-	-	54,488,789	**54,488,789**
වර්ෂය සඳහා ලාභය					99,047,789	**99,047,789**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**69,628,878**	**510,806**	**454,366,157**	**107,951,172**	**(18,714,487)**	**613,742,526**
පෙර වසරේ දෝෂ වලට ගැලපීම්					(1,387,226)	**(1,387,226)**
වර්ෂය සඳහා ලාභය	-	-	-		(105,744,071)	**(105,744,071)**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**69,628,878**	**510,806**	**454,366,157**	**107,951,172**	**(125,845,784)**	**506,611,229**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

	සටහන්	2020	2019
මෙහෙයුම් වලින් උපයන මුදල්		රු.	රු.
බදු වියදමට පෙර ලාභය		**(105,744,071)**	**99,047,789**
ගැලපීම් :			
වත්කම් බැහැර කිරීමේ ආදායම		-	(127,716)
VRS ක්‍රමක්ෂ ගාස්තු		-	2,465,874
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		7,129,839	6,964,310
පොලී වියදම්		36,856,652	74,236,920
ක්ෂයවීම්		26,414,467	25,928,260
ප්‍රාග්ධන වියදම් ක්‍රමක්ෂය		25,600,365	25,340,000
පෙර වසර ගැලපීම		(1,387,226)	(77,794,472)
ප්‍රදාන ක්‍රමක්ෂය		(25,340,000)	(25,340,000)
		(36,469,974)	**130,720,965**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්			
භාණ්ඩ වට්ටෝරු		18,220,995	(41,763,042)
වෙළඳ සහ අනෙකුත් ලැබීම්		15,275,152	19,892,872
වෙළඳ සහ අනෙකුත් ගෙවීම් - බදු සමග		20,912,419	(11,905,275)
මෙහෙයුම් වලින් ඉපයූ මුදල්		**17,938,592**	**96,945,520**
ගෙවන ලද පාරිතෝෂික		(1,821,898)	(573,540)
ගෙවන ලද පොලී		(36,856,652)	(74,236,920)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්		**(20,739,958)**	**22,135,060**
ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ			
වත්කම් බැහැර කිරීමේ ආදායම		-	164,256
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම		(1,869,331)	(6,665,294)
ආයෝජන කාර්යයන් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		**(1,869,331)**	**(6,501,038)**
මූල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ			
ලබා ගත් දිගු/කෙටි කාලීන ණය		26,707,791	273,000,000
ණය ආපසු ගෙවීම		(4,058,524)	(274,585,083)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		**22,649,267**	**(1,585,083)**
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**39,979**	**14,048,939**
වසර ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		22,609,235	8,560,296
වසර අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		**22,649,214**	**22,609,235**
බැංකු අයිරා	**18**	(5,353,692)	(6,320,701)
අනෑනි මුදල් සහ බැංකුවේ ඇති මුදල්	**12**	28,002,906	28,929,936
		22,649,214	**22,609,235**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.0 සමාගම

"ලක්සල" යන වෙළඳ නාමය යටතේ ජනප්‍රියව දන්නා සහ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (SLHB හෙවත් "ලක්සල") ශ්‍රී ලංකාව පුරා නිෂ්පාදනය කරන අත්කම් නිර්මාණ අලෙවි කරනු ලබන රජයට අයත් එකම ආයතනය වේ.

1.1 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සලහි ප්‍රධාන කාර්යයන් වන්නේ දේශීය සහ විදේශීය වෙළඳපලට ත්‍යාග සහ සිහිවටන අයිතම අලෙවිකරණය සහ විකිණීමයි.

2. සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.0 මිනුම් පදනම

මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය,විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ (මූල්‍ය ප්‍රකාශන) සටහන් ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී අයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs) අනුව සකස් කරන ලදී.

සාධාරණ අගය යටතේ මනින ලද මූල්‍ය වත්කම් සහ වගකීම් සඳහා හැරුණු කොට, මෙම මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමසඳහා ඇතැම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිත කිරීම අවශ්‍ය වේ. සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

2.1 ගිණුම්කරණ ඇස්තමේන්තු, උපකල්පන සහ තීන්දු භාවිතය

ප්‍රතිපත්ති සහ වාර්තාගත වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රකාශ, ප්‍රතිපත්ති අදාළ කරගැනීමට බලපාන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන ගොඩනැගීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමLKAS (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත) සහ SLFRS අනුකූලව සිදු කර ඇත.ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන ඓතිහාසික පරිචය සහ වෙනත් මූලාශ්‍ර මගින් නොපෙන්වන ඉදිරියට ගෙන ආ වත්කම් සහ වගකීම් වටිනාකම්, තීන්දු ගැනීමේ පදනම සකසන අවස්ථාවලදී ලැබෙන ප්‍රතිඵල යටතේ සාධාරණ යයි විශ්වාස කරන වෙනත් විවිධ සාධක මත පදනම්ව ඇත. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා ඉහත කී උපකල්පන ඉදිරියට ගෙනයන පදනම මත සමාලෝචනය කර ඇත.ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන, ඇස්තමේන්තු සංශෝධනය කරන කාලය තුලදී එකී සංශෝධන එකී කාලය සඳහා පමණක් හෝ සංශෝධනය කරන කාලයේදී සහ අනාගතයේදී බලපාන්නේ නම් හෝ වර්තමාන සහ අනාගත යන කාල දෙකම සඳහා බලපාන්නේ නම් හෝ එකී කාල තුලදී හඳුනාගෙන ඇත.

2.2 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අපේක්ෂා කළ හැකි අනාගත කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යාමට සංවිධානය සතු වගකීම පිළිබඳව අපි තක්සේරුවක් කර ඇත්තෙමු. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින්, ඇවර කිරීමේ හෝ වෙළඳාම නතර කිරීමේ අවශ්‍යතාවයක් අපි අපේක්ෂා නොකරමු.

2.3 සන්සන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාගම විසින් අඛණ්ඩව අදාළ කරගෙන ඇති අතර පෙර වසරේ භාවිතා කළ ඒවාට අනුකූල වන අතර අවශ්‍ය අවස්ථාවලදී සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා නැවත වර්ගීකරණය කර ඇත.

ශ්‍රී ලංකා හස්ථ කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.4 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව අදාළ කරගෙන ඇති අතර, මණ්ඩලය විසින් ද අඛණ්ඩව අදාළ කරගෙන ඇත.

2.4.1 ආදායම් හඳුනාගැනීම

සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි තාක් දුරට ආදායම හඳුනාගෙන ඇති අතර ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකිය. ආදායම මනිනු ලබන්නේ ලැබුණු හෝ ගිණුම්ගත කළ අගයේ සාධාරණ වටිනාකමට හෝ වෙළඳ වට්ටම් සහ අදාළ බදුවල ශුද්ධ ලැබිය යුතු අගයට වේ.

විදේශ මුදල් ගණුදෙණු, එම ගණුදෙනුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කරනු ලැබේ.

ශේෂ පත්‍ර දිනට විදේශ ව්‍යවහාර මුදලින් පවතින මූල්‍ය වත්කම් සහ වගකීම් එදිනට පවතින විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ.

2.4.2 දේපළ පිරියත සහ උපකරණ

අ) හඳුනා ගැනීම සහ මැනීම

දේපල, පිරියත සහ උපකරණ හඳුනාගැනීමේ පදනම වන්නේ දේපළ හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ මෙම වත්කම්වල පිරිවැය සත්‍ය ලෙස මැනිය හැකි නම් හඳුනාගැනිමයි.

ඉඩම් හැර දේපල පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂයවීම් සහ ඕනෑම සමුච්චිත හායන පාඩුවක් අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. එම පිරිවැයට, වත්කම් අත්කර ගැනීමට සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් ඇතුළත් වේ. ස්වයං-සාදන ලද වත්කම්වල පිරිවැයට ද්‍රව්‍ය පිරිවැය , සෘජු ශ්‍රමය, ඔවුන්ගේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයකට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් පිරිවැය, සහ භාණ්ඩ ගලවා ඉවත් කිරීම සහ පිහිටි ස්ථානයේ සවි කිරීමේ පිරිවැය ඇතුළත් වේ.

දේපල, පිරියත සහ උපකරණ එකිනෙකට වෙනස් ප්‍රයෝජනවත් ජීව කාල සහිත ප්‍රධාන උපාංගවලින් සමන්විත වන විට ඒවා දේපල, පිරියත සහ උපකරණවල වෙනම අයිතමයන් වශයෙන් ගිණුමගත කරනු ලැබේ.

දේපළ පිරියත සහ උපකරණවල ඉදිරියට ගෙන යන වටිනාකම නැවත ලබාගත නොහැකි බව පෙනී යන අවස්ථාවක ඉදිරියට ගෙන යන වටිනාකම හායනයක් ලෙස හඳුනා ගනී.

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක් අපහරණය කිරීමේදී ලැබෙන ලාභයක් හෝ අලාභයක් ඉදිරියට ගෙන යාමේ අගය සඳහා තීරණය කරනු ලබන අතර එය විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනු ලැබේ.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ආ)ක්ෂය වීම

ඇස්තමේනතුගත ප්‍රයෝජනවත් ජීව කාලයට එරෙහිව ලියා හැරීම සඳහා වන ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සින්නක්කර ඉඩම් හැර සියලු දේපල, පිරියත සහ උපකරණ පිරිවැය මත සරල රේඛා ක්‍රමයක් භාවිතා කරමිනි.

භාවිතා කරන ප්‍රධාන අනුපාත පහත පරිදි වේ.

1. ගොඩනැගිලි	2.5%
2. යන්ත්‍රෝපකරණ	10%
3. ඉන්වෙන්ට්‍රි ද්‍රව්‍ය	10%
4. ගෘහ භාණ්ඩ	10%
6.පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	20%

*2018 වසර දක්වා පරිගණක අයිතමවල ක්ෂයවීම් සිදු කරනු ලැබුවේ සරල රේඛා ක්‍රමයක් භාවිතා කරමිනි. නමුත් මෙම අයිතම වර්ෂ 8කට ඉහතදී මිලදී ගෙන ඇති බැවින් සරළ රේඛා ක්‍රමයට ගණනය කිරීමේදී ක්ෂය කළ අගය, එකතු කළ මුළු අගය ඉක්මවා යන බැවින් 2019 වර්ෂයේදී හීනවන ශේෂ ක්‍රමය භාවිත කිරීමට ලක්සලට සිදු විය.

ඇ) දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය / අලාභය.

දේපල, පිරියත සහ උපකරණ කාර්යයෙන් බැහැර කිරීමෙන් හෝ අපහරණය කිරීමෙන් වන යම් ලාභයක් හෝ පාඩුවක් විකිණීම සිදුවන කාලසීමාව තුල හඳුනා ගන්නා අතර අනෙකුත් මෙහෙයුම් ආදායම් ලෙස වර්ගීකරණය කරයි.

2.4.3 නොනිමි ප්‍රාග්ධනය

වර්ෂය තුළ දරන ලද, මූල්‍ය ප්‍රකාශ දිනට සම්පූර්ණ කර නොමැති ප්‍රාග්ධන වියදම්, අත්තිකාරම් ගෙවීම් ලෙස පෙන්වනු ලබන අතර, වර්ෂ අවසානයේදි සම්පූර්ණ කර ඇති ප්‍රාග්ධන වත්කම් භාවිතයට ගත් වර්ෂය අවසානයේ දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කර ඇත.

2.4.4 අස්පෘශ්‍ය වත්කම්

SLHB විසින් අත්පත් කර ගන්නා සීමිත ප්‍රයෝජනවත් ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් සමුච්ඡිත ක්‍රමක්ෂය සහ සමුච්ඡිත හායන පාඩු, එහි පිරිවැයෙන් අඩු කර මනිනු ලැබේ.

.

අ) හඳුනාගැනීමේ පදනම

වත්කම්වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට සම්භාවිතාවක් තිබේ නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගන්නා අතර සත්‍ය ලෙස මැනිය හැකි සහ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂ සහ සමුච්චිත අලාභ අඩු කළ අගය පිරිවැය ලෙස හඳුනාගනී.

ආ) පසුව සිදුවන වියදම්

පසුව සිදුවන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය අදාළ වන නිශ්චිත වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අභ්‍යන්තරව ජනනය කරන ලද වියදම්කීර්ති නාමය සහ වෙළඳ නාම ඇතුළු අනෙකුත් සියලුම වියදම්, ආදායම් ප්‍රකාශනයේ දැරූ ලෙස පිළිගැනේ.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ඇ) කාර්යයෙන් බැහැර කිරීම සහ අපහරණය
අපහරණය කිරීමේදී හෝ අපහරණයෙන් පසුව භාවිතයෙන් අපේක්ෂා කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති විට අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගනී.
ඈ) ක්‍රමක්ෂය කිරීම

අස්පෘෂ්‍ය වත්කම් භාවිතය සඳහා පවතින දින සිට ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත සරළ රේඛීය ක්‍රමයට ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂකරණය හඳුනා ගැනේ.

2.4.5 භායනය

වත්කම් භායනය පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේද යන්න තහවුරු කිරීම සඳහා SLHB හි වත්කම් ප්‍රමාණය එක් එක් මූල්‍ය ප්‍රකාශන ශේෂ පත්‍ර දිනයන්හිදී සමාලෝචනය කෙරේ. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, වත්කමේ ප්‍රතිස්ථාපන වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ඉදිරියට ගෙන යන වටිනාකම හෝ එයින් උත්පාදන කළ හැකි මුදල, එහි ප්‍රතිස්ථාපන වටිනාකම ඉක්මවන විටක භායන අලාභයක් හඳුනාගනු ලැබේ. ආදායම් ප්‍රකාශය තුළින්භායන පාඩු හඳුනා ගනු ලැබේ.

2.4.6 වෙළඳසහ වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ ලැබීම් යනු සාමාන්‍ය ව්‍යාපාරයේ දී විකුණන ලද භාණ්ඩ හෝ සේවා සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් ය. වසරක් හෝ ඊට අඩු කාලයකින් එකතු කිරීම අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දීර්ඝ නම්), ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කෙරේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ.

2.4.7 භාණ්ඩ තොග

භාණ්ඩ තොග,නියත සහ අළුත්වැඩියා කළ හැකි අයිතම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් අනතුරුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු විනාකමට අගය කරනු ලැබේ. පිරිවැය, බරතැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිතයෙන් තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුරදී තොගය විකිණිය හැකි මිල වේ.

2.4.8 මුදල් සහ මුදලට සමාන දෑ

අතැති මුදල් සහ ඉහළ ද්‍රවශීලතාවක් සහිත කෙටිකාලීන ආයෝජන, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් වටිනාකමට ඇතුලත් කළ හැකි මුදල් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි දෑ, අතැති මුදල් සමන්විත වන මුදල් සහ මුදල් හා සමාන වෙනත් දෑ, බැංකු අයිරාවක හිඟව තිබෙන ශුද්ධ මුදල් ප්‍රමාණය සහ කෙටි කාලීන ණය සහ කෙටි කාලීන ආයෝජන මුදල් සහ මුදලට සමාන දෑ යනුවෙන් නිර්වචනය කරයි.

2.4.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අංක 07- මුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව වක්‍ර ක්‍රමය භාවිත කරමින් සකස් කර ඇත.

2.4.10 සේවක ප්‍රතිලාභ

අ) අනිවාර්ය ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ වන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා වන වගකීම, 2020 කාලපරිච්ඡේදය තුල ආයතනයේ සේවකයන් 123 දෙනෙකු ආවරණය කරනු ලබන නිශ්චිත වූ ප්‍රතිලාභ සැලැස්මකි. මෙම වගකීම සම්පූර්ණ කිරීම සඳහා සෑම සේවකයකුගේම සේවය ආරම්භ කළ පළමු වර්ෂයේ සිට සම්පූර්ණ කරන සෑම වර්ෂයක් සඳහාම අදාළ මූල්‍ය වර්ෂයේ අවසාන මාසයේ වැටුපෙන් අඩක් මත පදනම් ව ගණනය කළ මුදලට සමාන වෙන් කිරීමක් මූල්‍ය ප්‍රකාශන දිනට ඉදිරියට ගෙනයනු ලැබේ. වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ආ වෙන්කිරීම් සහ වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන ගිය වෙන් කිරීම් අතර වෙනස විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ සළකා බලනු ලැබේ.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ආ) අනිවාර්ය දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ නියෝග අනුව සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සහ සේවක භාර ආරමුදලට දායකත්වය සඳහා සේවකයන් සුදුසුකම් ලබයි. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සේවකයන්ගේ පූර්ණ සේවා නියුක්තිය මත සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට පිළිවෙලින් 12% සහ 3%ක දායකත්වයක් දක්වයි.

2.4.11 ණය ගැනීම්

ණය ගැනීම් මූලිකව, සාධාරණ අගය, ගණුදෙනුවල පිරිවැයේ ශුද්ධ අගයට හඳුනාගනු ලැබේ. පසුගිය කාලවලදී ණය ගැනීම් මිල සඳහන් කරනු ලැබුවේ සළුල පොලී ක්‍රමය භාවිත කරමින් හිලව් කළ පිරිවැයටය. එම කටයුත්තේ යම් වෙනසක් (ශුද්ධ ගණුදෙනු පිරිවැය) සහ ණය නිදහස් කිරීමේ වටිනාකම ණය ගැනීම් කළ කාලය තුල ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනියි.

2.4.12 වගකීම් සහ වෙන් කිරීම්

අතීත සිද්ධින්වල ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන නෛතික/සාධනීය බැඳීමක් පවතින විට වගකීම් සහ වෙන් කිරීම් මුල්‍ය ප්‍රකාශනවල පිළිගනු ලබන අතර, ඒවා පියවීම තුලින් ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලා යාම අපේක්ෂා කෙරේ. මුල්‍ය ප්‍රකාශන දින සිට වර්ෂයක් ඇතුළත ණය හිමියන්ගේ ඉල්ලීම පිට ගෙවිය යුතු බැඳීම් මුල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් ලෙස සැළකේ. මුල්‍ය ප්‍රකාශන දින සිට වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු වගකීම් මුල්‍ය තත්ත්ව පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් ලෙස සැළකේ.

අ) ගෙවිය යුතු වෙළඳ සහ වෙනත් බැඳීම්

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුල සැපයුම්කරුවන් වෙතින් ලබා ගත් භාණ්ඩ හා සේවා සඳහා ගෙවිය යුතු බැඳීම් ගෙවිය යුතු වෙළඳ බැඳීම් වේ. ගෙවීම වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් තුලදී (දීර්ඝ ව්‍යාපාර කටයුත්තකදී නම් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල) ගෙවිය යුතු වේ නම් එම ගෙවියයුතු ගිණුම් ජංගම වගකීම් ලෙස වර්ග කෙරේ. එසේ නොවේ නම් ඒවා ජංගම නොවන වගකීම් ලෙස ඉදිරිපත් කෙරේ.

නියෝජන තොග ඇතුළුව සියළු මිලදී ගැනීම් සඳහා භාණ්ඩ ලැබීමේ පත්‍ර රැස් කිරීමේ අවස්ථාවේ ගිණුම් පොත්වල වගකීම් වාර්තා කිරීමේ ප්‍රතිපත්තිය ලක්සල අනුගමනය කර තිබුණි.

2.4.13 ආදායම් බදු

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය මෙහෙයුම් කටයුතු සහ උපයනු ලබන බදු අයකළ හැකි ආදායම් සම්බන්ධයෙන් මුල්‍ය තත්ත්ව ප්‍රකාශන ඉදිරිපත් කරන දිනට මෙරට පනවා ඇති හෝ හරයාත්මකව පනවා ඇතිබදු නීතිය මත පදනම්ව වර්තමාන ආදායම් බදු ගාස්තු ගණනය කරයි. අදාළ බදු නියාමනය අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තාවල තත්ත්වයන් කළමනාකරණය වරින් වර ඇගයීමට ලක් කරයි. බදු අධිකාරිය වෙත ගෙවීමට අපේක්ෂිත මුදල මත පදනම්ව අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිපාදන සළසයි.

භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකුණුම් ආදායම, ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිලාභ, වෙළඳ වට්ටම් සහ ප්‍රමාණ වට්ටම් පිළිබඳ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මනිනු ලැබේ. හිමිකාරිත්වයේ සුවිශේෂී අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට මාරු වී ඇති, ප්‍රතිශ්ඨාව අයකර ගැනීමට හැකි, ආශ්‍රිත පිරිවැය සහ භාණ්ඩවල විභව්‍ය ප්‍රතිලාභ විශ්වාසනීයව ඇස්තමේන්තු කළ හැකි සහ භාණ්ඩ පිළිබඳ කළමනාකරණයේ සම්බන්ධයක් නොමැති අවස්ථාවක ආදායම හඳුනාගනු ලැබේ. අවදානම සහ ප්‍රතිලාභ මාරු වීම භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ පුද්ගලික නියමයන් අනුව වෙනස් වේ.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වෙනත් මෙහෙයුම් ආදායම්

අ) දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය සහ පාඩුව

ආ) දේපළ , පිරියත සහ උපකරණ කාර්යයෙන් බැහැර කිරීම හෝ අපහරණය කිරීම මත ලාභ හෝ පාඩු විකිණීම සිදු කළ කාල පරිච්ඡේදය තුල හඳුනාගන්නා අතර වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

ලැබුණු ප්‍රදාන

වියදම් සම්බන්ධයෙන් රජය ප්‍රදාන ලබා දෙන්නේ නම්, එය හිලව් කිරීමට අදහස් කරන පිරිවැයට ගැලපීම සඳහා අවශ්‍ය කාල පරිච්ඡේදය තුල ආදායමක් ලෙස හඳුනා ගනියි. ප්‍රදානය වත්කමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, සාධාරණ අගය විලම්භිත ආදායම් ගිණුමකට බැර කර අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය පුරා සමාන වාර්ෂික වාරික මගින් ආදායම් ප්‍රකාශයට නිදහස් කරනු ලැබේ.

ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන

ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමක් වශයෙන් හඳුනාගෙන අවුරුදු 10කින් ක්‍රමක්ෂය කරනු ලැබේ.

ලැබුණු ජංගම ප්‍රදාන

ආදායම් සම්බන්ධ ප්‍රදාන ‘වෙනත් ආදායම්‘ වශයෙන් වෙනමම වාර්තා කිරීම හෝ අදාළ වියදම්න් අඩු කිරීම කරනු ලැබේ.

2.4.14 වියදම් හඳුනාගැනීම

දරනලද පිරිවැය සහ විශේෂිත ආදායම් අයිතමයන්ගේ ඉපයීම් අතර සෘජු සම්බන්ධය පදනම් කරගනිමින්අදායම් ප්‍රකාශයේ වියදම හඳුනාගනු ලැබේ. ව්‍යාපාර කටයුතු තුළදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමේදී උද්ගත වන සියළු වියදම් ආදායම් ප්‍රකාශයට ආරෝපණය කර ඇත.

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා සමාගමේ සහ සමූහයේ කාර්ය සාධනයේ අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන පදනම මත, “වියදම් ශ්‍රිත” ක්‍රමය අනුගමනය කර ඇත.

අ) පුනරාවර්තන වියදම්

ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති පරිදි මණ්ඩලය විසින් උපයා ඇති ලාභය සියළුම ප්‍රකාශිත වගකීම් සඳහා සහ දේපළ පිරියත සහ උපකරණ ක්ෂය සඳහා වෙන් කිරීම් කළ පසුව ඉපයූ ලාභ වේ.

ආ) ප්‍රාග්ධන වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ධාරිතාව වැඩි කිරීමේ අරමුණින් ස්ථීර ස්වභාවයේ වත්කම් වැඩි කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

දේපළ, පිරියත සහ උපකරණ අපහරණය කිරීම මත ආදායම් ස්වභාවයේ ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කර ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.4.15 ණය ගැනීමේ පිරිවැය

ණය ගැනීමේ පිරිවැය ඒවා දරණ ලද වර්ෂය තුලදී වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

2.4.16 බැඳීම් සහ අවිනිශ්චිතතා

අවිනිශ්චිතතා යනු පසුගිය සිද්ධින් මගින් පැන නගින ලද සහ මණ්ඩලයේ පාලනයෙන් බැහැර අනාගත අවිනිශ්චිත සිද්ධියක් ඇති වීම හෝ ඇති නොවීම මත පමණක් නිශ්චය කරගනු ලබන විභව්‍ය වත්කම් හෝ බැඳීම් වේ.

2.4.17 ශේෂ පත්‍ර දිනට පසුව හට ගන්නා සිද්ධින්

සියළුම වැදගත් ශේෂ පත්‍ර පසු සිද්ධින් අදාළ අවස්ථාවලදී හෙළිදරව් කර ගළපා තිබේද යන්න සළකා බලා ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

3. ආදායම	2020	2019
	රු.	රු.
ප්‍රදර්ශනාගාරවල අලෙවිය		
තුම්මුල්ල	79,691,725	265,742,091
කෞතුකාගාරය	19,175,538	76,213,119
ගාල්ල	19,452,867	60,187,419
පේරාදෙණිය	16,075,609	54,632,521
කටුනායක	11,240,568	33,397,236
කොටුව	10,143,012	28,098,047
වැලිපැන්න 1	11,152,021	32,087,176
බත්තරමුල්ල	5,698,666	18,543,344
මහනුවර	8,247,892	15,160,845
කටුබැද්ද	5,017,082	15,415,364
පින්නවල	4,178,202	10,473,120
නුවරඑළිය	1,818,842	3,341,825
මුළු ප්‍රදර්ශනාගාර විකුණුම්	191,892,024	613,292,107
සෘජු/පාරිභෝගික අභිරුචි කළ ඇණවුම්	2,847,980	9,066,676
	194,740,004	**622,358,783**
ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)	-	(5,062,438)
	194,740,004	**617,296,345**

4. වෙනත් ආදායම්	2020	2019
	රු.	රු.
කුලී ආදායම	5,883,099	10,727,613
ඉතුරුම් ගිණුමේ පොලී	81,044	78,627
විදේශ විනිමය ලාභය	854,669	-
	6,818,812	**10,806,240**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

5. පරිපාලන වියදම්	සටහන්	2020 රු.		2019 රු.	
වැටුප් සහ දීමනා		69,534,613		78,609,104	
දිරිදීමනාව		-		8,171,280	
ඊ.පී.එෆ්. සහ ඊ.ටී.එෆ්. (E.P.F. & E.T.F.)		9,886,048		10,277,712	
පාරිතෝෂිකය		7,129,839		7,278,099	
ප්‍රවාහන දීමනාව		4,965,599		13,501,559	
අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ මණ්ඩල රැස්වීම් වියදම්		548,939		1,301,166	
විගණන ගාස්තු/වෘත්තීය ගාස්තු		1,410,000		1,567,992	
නීති ගාස්තු		135,800		891,040	
ආරක්ෂක ගාස්තු		11,184,146		15,356,646	
කුලී සහ වරිපණම්		16,467,874		36,212,970	
විදුලිය		10,687,551		19,536,248	
ක්ෂය වීම		26,414,467		25,928,260	
පිරිසිදු කිරීමේ සේවා		4,927,744		7,978,668	
අනෙකුත් කාර්ය මණ්ඩල පිරිවැය *	5.1	3,810,173		19,424,090	
වෙනත් මෙහෙයුම් පිරිවැය *	5.2	21,518,789		46,541,184	
			188,621,582		**292,576,018**

උප සටහන

5.1

අනෙකුත් කාර්ය මණ්ඩල පිරිවැය යටතේ ඇතුළත් වේ *	**2020** **රු.**		**2019** **රු.**	
අතිකාල	-		7,958,682	
බෝනස්	-		1,741,500	
සේවක සුබසාධක	2,582,908		5,601,924	
මුදල් ආරක්ෂණ පොලී	212,241		213,769	
කාර්යමණ්ඩල පුහුණුව	29,000		279,589	
වෛද්‍ය වියදම්	986,024		1,162,752	
VRS	-		2,465,874	
		3,810,173		**19,424,090**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

උප සටහන	**2020**		**2019**	
5.2	**රු.**		**රු.**	
වෙනත් මෙහෙයුම් පිරිවැය යටතේ ඇතුළත් වේ *				
උපදේශන ගාස්තු	-		76,500	
වෙළඳ දැන්වීම්	324,924		1,089,270	
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	1,146,501		2,614,117	
පුවත් පත්‍රිකා සහ වාර ප්‍රකාශන	7,590		63,090	
තැපැල් ගාස්තු/දුරකථන/ටෙලෙක්ස්	11,029,945		11,913,311	
ඉන්ධන සහ ලිහිසි තෙල්	595,729		1,439,559	
තොග සත්‍යාපනය	210,356		377,900	
වෙළඳ බලපත්‍ර ගාස්තු	252,720		252,720	
පරිගණක වියදම්	170,005		245,919	
රක්ෂණය	278,607		2,384,270	
ජල බිල්පත	368,221		475,049	
අලුත්වැඩියාව සහ නඩත්තුව - ගොඩනැගිල්ල	1,322,226		8,627,199	
අලුත්වැඩියාව සහ නඩත්තුව - යන්ත්‍රෝපකරණ	1,272,935		1,545,930	
වාහන කුලියට දීමේ ගාස්තු	3,025,968		10,930,281	
ප්‍රදාන සහ ගොඩනැගිලි ක්‍රමක්ෂ කිරීම-ශුද්ධ වෙනස	260,365		-	
සහන ගාස්තු	1,197,707		4,500,416	
විවෘත කිරීමේ උත්සව වියදම්	49,734		-	
මුද්දර ගාස්තු	5,256		5,653	
		21,518,789		**46,541,184**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

6. බෙදාහැරීමේ වියදම්	සටහ	2020	2019
		රු.	රු.
උපදේශක කොමිස්		12,089,387	35,276,106
ක්‍රෙඩිට් කාඩ් කොමිස්		2,415,398	7,732,406
ඇසුරුම් ද්‍රව්‍ය දේශීය		1,157,820	5,138,417
ව්‍යාපාර ප්‍රවර්ධනය		356,236	1,831,203
අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම භාණ්ඩ මිලදී ගැනීම		102,760	286,269
ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු		-	15,365
භාණ්ඩ ප්‍රවාහනය		79,300	133,825
ගමන් වියදම්		1,038,372	2,499,417
තක්සේරු වියදම්		77,420	204,908
රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන ගාස්තු		161,511	652,274
විශේෂ ඇණවුම් වියදම්		356,535	32,650
		17,834,739	**53,802,840**

7. මූල්‍ය පිරිවැය	2020	2019
	රු.	රු.
බැංකු ගාස්තු	148,333	345,488
අයිරා පොලී	-	5,912
ණය පොලී - ලංකා බැංකුව	27,033,067	54,337,642
- ප්‍රා.ස.බැ.	9,823,585	19,899,278
	37,004,985	**74,588,320**

8. බදු

මෙහි දක්වා ඇති ගෙවිය යුතු මුදල් පසුගිය වසරවල සමුච්චිත වන අතර ඒවා මණ්ඩලය මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් පියවා නැත. 2019 වසරේ සිට, මණ්ඩලය බදු නීතිවලට අනුකූල වීම සඳහා ක්‍රමානුකූලව බදු ගෙවීම ආරම්භ කර ඇත.

09. දේපල, පිරියත සහ උපකරණ

	සටහන්	2020 රු.	2019 රු.
ඝන්නක්කර වත්කම්	9.1	698,222,582	723,573,692
ගොඩනැගිලි සංවර්ධන පිරිවැය	9.2	198,897,809	223,692,208
		897,120,391	**947,265,900**

9.1 ඝන්නක්කර වත්කම්

	ඉඩම්	ගොඩනැගිලි	පිරියත සහ යන්ත්‍රෝපකරණ	ගෘහභාණ්ඩ උපාංග සහ කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	ලිපි	ඝිදු වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය හෝ තක්සේරුව								
2019 ජනවාරි 1 දිනට ශේෂය	396,037,214	248,797,761	100,601,721	59,670,175	30,886,409	31,109,750	45,451,390	**912,554,420**
එකතු කිරීම්		-	299,439	488,054	2,450,757	1,433,624	-	**4,671,874**
බැහැර කිරීම්			(104,399)					**(104,399)**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**396,037,214**	**248,797,761**	**100,796,761**	**60,158,229**	**33,337,166**	**32,543,374**	**45,451,390**	**917,121,895**
බැහැර කිරීම්								-
එකතු කිරීම්	-	-	110,730	21,500	75,150	855,985	-	**1,063,365**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**396,037,214**	**248,797,761**	**100,907,491**	**60,179,729**	**33,412,316**	**33,399,359**	**45,451,390**	**918,185,260**
ක්ෂය වීම්								
2019 ජනවාරි 1 දිනට ශේෂය	-	32,640,398	53,127,011	34,478,499	29,472,703	16,761,239	-	**166,479,850**
ගැලපීම්		1,207,954						**1,207,954**
බැහැර කිරීම			(67,859)					**(67,859)**
වර්ෂය සඳහා අය කිරීම	-	6,203,277	10,066,673	5,992,428	501,649	3,164,231		**25,928,258**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය		40,051,629	63,125,825	40,470,927	29,974,352	19,925,470		**193,548,203**
ගැලපීම්								-
බැහැර කිරීම								-
වර්ෂය සඳහා අය කිරීම	-	6,203,277	10,089,835	6,016,898	781,157	3,323,308		**26,414,475**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**46,254,906**	**73,215,660**	**46,487,825**	**30,755,509**	**23,248,778**	**-**	**219,962,678**
ඉදිරියටගෙන ආ ප්‍රමාණයන්								
2019 දෙසැම්බර් 31 දිනට	396,037,214	208,746,132	37,670,936	19,687,302	3,362,814	12,617,904	45,451,390	723,573,692
2020 දෙසැම්බර් 31 දිනට	**396,037,214**	**202,542,855**	**27,691,831**	**13,691,904**	**2,656,807**	**10,150,581**	**45,451,390**	**698,222,582**

9.2 ගොඩනැගිලි සංවර්ධන වියදම්

	2020 LKR	2019 LKR
පිරිවැය හෝ සලකන ලද පිරිවැය		
ජනවාරි 1 දිනට ශේෂය	386,446,053	384,452,630
අතිරේක	805,966	1,993,423
දෙසැම්බර් 31 දිනට ශේෂය	387,252,019	386,446,053
ක්‍රමක්ෂය		
ජනවාරි 1 දිනට ශේෂය	**162,753,845**	**137,413,843**
වසර සඳහා අය කිරීම	25,600,365	25,340,002
දෙසැම්බර් 31 දිනට ශේෂය	**188,354,210**	**162,753,845**
ඉදිරියටගෙන ආ ප්‍රමාණයන්		
ජනවාරි 1 දිනට	223,692,208	247,038,787
අතිරේක	805,966	1,993,423
දෙසැම්බර් 31 දිනට	**198,897,809**	**223,692,208**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

9.2 ගොඩනැගිලි සංවර්ධන වියදම් (සම්බන්ධිතයි)

ක්‍රමක්ෂය ස්ථානය	වසර	දරන ලද පිරිවැය	අගය දශම ස්ථාන දෙකකට	2020 ජනවාරි 01 දිනට සමුච්චිත ක්‍රමක්ෂ ශේෂය	2020 තුළ ක්‍රමක්ෂය	2020 දෙසැම්බර් 31 ට සමුච්චිත ක්‍රමක්ෂ ශේෂය	2020 දෙසැම්බර් 31 දිනට රැගෙන ආ ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රමාණය
කෞතුකාගාරය	2013	172,847,765					
කෞතුකාගාරය	2014	1,881,295					
කෞතුකාගාරය	2015	389,177					
එකතුව		**175,118,237**	5.77%	63,848,983	10,101,214	73,950,197	101,168,040
බත්තරමුල්ල	2013	117,704,905					
බත්තරමුල්ල	2014	7,119,771					
බත්තරමුල්ල	2015	9,744,207					
එකතුව		**134,568,883**	5.77%	47,836,285	7,762,237	55,598,522	78,970,361
පින්නවල	2013	10,086,000	10.00%	7,060,200	1,008,600	8,068,800	2,017,200
වාගොල්ල	2014	810,487	10.00%	486,291	81,049	567,340	243,147
පේරාදෙණිය	2013	31,657,966					
පේරාදෙණිය	2014	8,968,353					
පේරාදෙණිය	2015	677,220					
එකතුව		**41,303,539**	10.00%	27,880,198	4,130,354	32,010,552	9,292,987
වැලිපැන්න	2013	10,269,019	10.00%	7,188,315	1,026,902	8,215,217	2,053,802
තුරඟ නරඟ පිටිය	2013	1,113,613	10.00%	779,526	111,361	890,887	222,726
කටුනායක	2013	1,060,000	10.00%	742,000	106,000	848,000	212,000
උණවටුන	2013	1,000,000	10.00%	700,000	100,000	800,000	200,000
K-Zone	2013	8,353,071	10.00%	5,847,147	835,306	6,682,453	1,670,618
තුන්මුල්ල		769,781	10.00%	384,898	76,977	461,875	307,906
මහනුවර	2019	1,993,423		-			
		805,966					
		2,799,389	10.00%		260,366	260,366	2,539,023
මුලු එකතුව		**387,252,019**		**162,753,843**	**25,600,366**	**188,354,209**	**198,897,810**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

10. භාණ්ඩ වට්ටෝරු	සටහන්	2020 රු.	2019 රු.
ප්‍රදර්ශනාගාර වෙළඳාම - ගුණාත්මයෙන් ඉහළම නිමි භාණ්ඩ		469,284,075	490,273,215
ගුණාත්මයෙන් දෙවන හානි වූ භාණ්ඩ		148,076,152	145,301,255
අමුද්‍රව්‍ය සහ කෙරෙමින් පවතින වැඩ	**10.1**	1,849,358	1,856,110
		619,209,585	**637,430,580**

* 2019 වසරේ දෙවැනි තත්ත්වයේ තිබූ රුපියල් 1,629,137.00 ක තොග වටිනාකම් 2020 දී ඉහළම තත්ත්වයේ තොග වෙත මාරු කරන ලදී.

10.1 අමුද්‍රව්‍ය සහ කෙරෙමින් පවතින කාර්යයන්

අමුද්‍රව්‍ය සහ ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයන් පාරිභෝගික අභිරුචිය මත සාදන ලද සෘජු ඇණවුම් සඳහා නිෂ්පාදනය කරන ලද අයිතම වලින් සමන්විත වේ.

11. වෙළඳ සහ අනෙකුත් ලැබීම්	සටහන්	2020 රු.	2019 රු.
වෙළඳ ලැබීම්	**11.1**	8,851,463	15,849,569
අනෙකුත් ලැබීම්	**11.2**	14,605,047	20,086,262
තැන්පතු සහ පෙරගෙවුම්	**11.3**	47,628,507	50,424,338
		71,085,017	**86,360,169**
11.1 වෙළඳ ලැබිය යුතු			
වෙළඳ ණය ගැනියන්		8,765,105	13,019,327
ලැබිය යුතු ක්‍රෙඩිට් කාඩ්		86,358	2,830,242
		8,851,463	**15,849,569**
11.2 වෙනත් ලැබිය යුතු දේ			
කාර්ය මණ්ඩල ණය		897,500	116,250
ලැබිය යුතු කුලිය		4,625,800	10,921,900
ලැබිය යුතු ESC		9,049,198	9,049,198
ලැබිය යුතු විවිධ		32,549	(1,086)
		14,605,047	**20,086,262**
11.3 තැන්පතු සහ පෙරගෙවුම්			
ආරක්ෂක තැන්පතු		1,925,446	1,925,446
පෙරගෙවුම්		4,174,854	5,706,303
අත්තිකාරම් ගෙවීම්		20,168,978	22,511,554
රඳවා තබා ගැනීමේ මුදල්		12,502,564	12,502,564
ආපසු ගෙවිය හැකි තැන්පතු		9,037,344	7,881,157
වැන්දඹු අනත් දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය		-	77,993
ලැබිය යුතු ඇපකර		(180,679)	(180,679)
		47,628,507	**50,424,338**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

	2020	2019
	රු.	රු.
12. මුදල් සහ මුදල්වලට සමාන දෑ		
බැංකුවේ ඇති මුදල්	27,471,630	26,888,268
අතැති මුදල්	531,276	2,041,668
	28,002,906	**28,929,936**
ආදායම් සංචිතයේ අනෙකුත් සංරචක		
ආරම්භක ශේෂය	(123,528,974)	(178,017,763)
පෙර වසරේ සංශෝධනය	(1,387,226)	54,488,789
	(124,916,200)	**(123,528,974)**

ආදායම් සංචිතයේ ඇති අනෙකුත් සංරචක අතරට සමුච්චිත ආදායම් සංචිත හරහා ප්‍රත්‍යවේක්ෂණ කර සම්මත කරන ලද පූර්ව කාල පරිච්ඡේදවලට අදාළ සංශෝධන ඇතුළත් වේ.

	2020	2019
	රු.	රු.
13. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්		
ආරම්භක ශේෂය	50,896,038	44,191,479
වසර සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන	7,129,839	7,278,099
වසර තුළ ගෙවන ලද පාරිතෝෂිකය	(1,821,898)	(573,540)
අවසන් ශේෂය	**56,203,979**	**50,896,038**

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බැඳීම සංවිධානයේ සේවකයින් 123ක් ආවරණය වන පරිදි නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

14. විලම්බිත ආදායම
දීමනාව පිළිබඳ විස්තරය

	වසර	ක්‍රමක්ෂය වීමේ අනුපාතය	ලැබී ඇති මුල් දීමනාව	2019 දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය	2020 තුළ ක්‍රමක්ෂ කළ මුදල	2020 දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය
ආර්ථික සංවර්ධන	**2012**	10%	100,000,000	20,000,000	10,000,000	**10,000,000**
වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	**2013**	10%	36,000,000	10,800,000	3,600,000	**7,200,000**
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	10,224,643	3,067,393	1,022,464	**2,044,929**
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	42,109,637	16,843,854	4,210,964	**12,632,890**
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	11,099,920	3,329,976	1,109,992	**2,219,984**
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	7,828,426	2,348,530	782,843	**1,565,687**
ආර්ථික සංවර්ධන	**2014**	10%	35,000,000	14,000,000	3,500,000	**10,500,000**
අයවැය ප්‍රතිපාදන	**2014**	10%	11,137,374	4,454,960	1,113,737	**3,341,223**
එකතුව			**253,400,000**	**74,844,713**	**25,340,000**	**49,504,713**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

	2020	2019
	රු.	රු.
15. දිගුකාලීන ණය ගැනීම්		
ආර්මිභක ශේෂය	431,726,929	303,929,372
වර්ෂය තුළ ලබාගත් ණය	8,323,585	273,000,000
වසර තුළ ගෙවූ ණය	(327,105)	(145,202,443)
අවසන් ශේෂය	439,723,409	431,726,929
(අඩු කළා) වසරක් ඇතුළත ගෙවිය යුතු	(54,444,000)	(43,076,000)
දිගුකාලීන ණය බැඳීම්	**385,279,409**	**388,650,929**

15.1 ලංකා බැංකුව - 2020 අවසන් වන විට ණය ශේෂය රුපියල් මිලියන 273

ආරම්භයේ දී කොටුව ගොඩනැගිල්ල උකස් කර කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රුපියල් මිලියන 950 කට 2012 සිට 2018 දක්වා කාලය තුළ ණය ලබා ගන්නා ලදී. ලබාගත් ණය මුදලින් ප්‍රදර්ශනාගාර වැඩි දියුණු කරන අතරම, ලක්සල ණය ගෙවීමේ සඳහා ආදායමේ සැලකිය යුතු වර්ධනයක් ලබා ගත්තේය. අවසානයේ ප්‍රාග්ධන ණය ප්‍රමාණය පියවූ අතර 2013 වසරේ සිට 2019 දක්වා ලංකා බැංකු ණය රුපියල් මිලියන 273 දක්වා අඩු කෙරිණි.

15.2 2019 මූල්‍ය වර්ෂය තුළ පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් සමාගම පළමු කාර්තුවෙන් පසු පසුබෑමකට ලක් විය. එබැවින් පැවති තත්ත්වය සමතුලිත කිරීමට තිබූ ණය නැවත සකස් කෙරිණි. කෙටි කාලීන චක්‍රීය ණය සමඟ දිගුකාලීන ණය 8 ක ණය ශේෂයන් අවලංගු කරන ලද අතර ඉතිරි ණය ප්‍රාග්ධනය වන රුපියල් මිලියන 273, 2019 වර්ෂයේදී නැවුම් ණය ලෙස නිකුත් කරන ලදී.
2019 වර්ෂයේ දී රුපියල් මිලියන 273ක් සඳහා ගෙවීමට නියමිත ප්‍රතිව්‍යුහගත ණය පහත පරිදි ණය 3කින් ලබා දී ඇත.:
පහසුකම 1 – කාලීන ණය රු.40,000,000/=
පහසුකම 2 – කාලීන ණය රු.200,000,000/=
පහසුකම 3 – කාලීන ණය රු.33,000,000/=

15.3 ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - රු.මි.200

හදිසි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා 2013 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කැලණිය ශාඛාවෙන් රුපියල් මිලියන 200ක පහසුකමක් ලබා ගන්නා ලදී. මහා භාණ්ඩාගාරය බැංකුව හරහා ණය පහසුකම් සලසා දී ඇති බැවින් ලක්සල ආයතනයෙන් කිසිදු ඇපයක් ලබා දී නොමැත. 2020 වර්ෂයේදී COVID-19 නිසා ඇති වූ මූල්‍ය තත්ත්වය හේතුවෙන් ලක්සලට ගෙවීමට නොහැකි වූ රුපියල් මිලියන 8.3 ක පොලිය ප්‍රාග්ධනීකරණය කරන ලදී.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

	2020 රු.	2019 රු.
16. වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ		
වෙළඳ ගෙවිය යුතු	334,334,840	338,046,682
වෙනත් ගෙවිය යුතු	112,410,635	104,787,627
උපචිත වියදම්	75,811,084	54,162,087
	522,556,559	**496,996,396**
17. කෙටි කාලීන ණය ගැනීම්		
දිගුකාලීන ණය බැඳීම්වල වත්මන් කොටස	54,444,000	43,076,000
කෙටි කාලීන ණය	14,652,784	
	69,096,784	**43,076,000**

** පසුගිය වසරේ කෙටි කාලීන ණය ගැනීම් ලෙස ගණන් ගනු ලැබූ ගෙවිය යුතු පොළී, කෙටි කාලීන ණය ගැනීම්වලින් ඉවත් කර 2020 දී ගෙවිය යුතු අනෙකුත් ගෙවීම් යටතට ගෙන එනු ලැබිණි.

	2020 රු.	2019 රු.
18. බැංකු අයිරා		
බැංකු අයිරා	**5,353,692**	**6,320,701**

රුපියල් 5,353,692.00 (2019: රුපියල් 6,320,701.00) බැංකු අයිරාව වසර අවසාන වන විට මුදල් පොතේ දිස්වන ශේෂයයි. මූල්‍ය වර්ෂයේ ලංකා බැංකුවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ රුපියල් මිලියන 15ක අයිරා පහසුකම සඳහා බැංකුව විසින් අනුමැතිය ලබා දෙන ලදී..

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

19. අවිනිශ්චිත වගකීම් සහ කැපවීම්

මණ්ඩලයට එරෙහිව විභාග වෙමින් පැ

උසාවි අංක	නඩුව ගොනු කළේ	නඩුව ගොනු කරනු ලැබුවේ	නඩුවේ ස්වභාවය	වත්මන් තත්ත්වය
DMR/0280/13	2015-07-13	කෝට්ටේ මහ නගර සභාව	සූර්ය පැනල සවිකිරීමේ කොන්ත්‍රාත්තුව උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව කෝට්ටේ මහ නගර සභාව විසින් දිසා අධිකරණයේ ගොනුකළ නඩු	රු. 4,020,000ක් පොලිය සමඟ කෝට්ටේ මහ නගර සභාවට ගෙවීමට තීරණය විය. කෙසේ වෙතත් මෙම නඩුවට අදාළව ලක්සල ආයතනය විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අධිකරණ තීන්දුව ලබා දුන් බැවින්, 2020 දෙසැම්බර් 31 වන විට ගෙවිය යුතු මුදලට සමාන මුදලක්
DMR/2255/16	2016-05-09	ඩිමෝ පුද්. සමාගම	ඉතිරි මුදල් නොගෙවා කොන්ත්‍රාත්තුව උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව ඩිමෝ විසින් දිසා අධිකරණයේ ගොනු කරන ලද නඩු.	තීරණය තවමත් ලබා දී නොමැති අතර 2020 දෙසැම්බර් 31 වන දිනට කිසිදු සසම්භාව්‍ය බැඳීමක් නොපවතී
138/2018/MR	2018-03-08	JAT හෝල්ඩිංග්ස් පුද්. සමාගම	ලක්සල විසින් සංචාරක මණ්ඩලයෙන් ලබාගෙන JAT හෝල්ඩිංග්ස් වෙත උප කොන්ත්‍රාත්තුවක් ලබා දී ගෙවීමට ඇති රු. 8,184,683.49 ක ගෙවීමක් සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ ගොනු කරන ලද නඩු	ලක්සල (SLHB) වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව විරෝධතා ඉදිරිපත් කර ඇත.
139/2018/MR	2018-04-10	JAT හෝල්ඩිංග්ස් පුද්. සමාගම	ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 22 වැනි මහලේ පිහිටි බේරුම්කරණ මධ්‍යස්ථානය (Arbitration centre) ප්‍රතිසංස්කරණය කිරීමට ලක්සල අධිකරණ අමාත්‍යාංශය සමඟ ගිවිසුමක් අත්සන් කර ඇත. ලක්සල මෙය JAT හෝල්ඩිංග්ස් සමාගමට උප කොන්ත්‍රාත්තුවක් මගින් ලබා දී තිබූ අතර වැඩ අවසන් කර ඇත. නමුත් අධිකරණ අමාත්‍යාංශය JATහෝල්ඩිංග්ස් වෙත ගෙවිය යුතු ඉතිරි මුදල් පියවා තිබුණේ නැත. එබැවින් රුපියල් 32,256,980 ක මුදලක් නොගෙවීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව JAT	ලක්සල (SLHB) වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව විරෝධතා ඉදිරිපත් කර ඇත.

අභ්‍යන්තර විමර්ශන

2015 වසරේ වැඩ තහනම් කර ඇති ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව අභ්‍යන්තර විමර්ශන පැවැත්විණි.
අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය තවම ලබා දී නොමැත

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IMT/B/SLHB/189/2020/FS

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි 19 දින

සභාපති,

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් : -

1. ලේකම්, බදාදික්, අත්‍යන්ත්‍ර, රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය.
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. IMT/B/SLHB/189/2020/FS ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 මැයි 19 දින

සභාපති
ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02හි 34 වගන්තිය ප්‍රකාරව "තොග සම්බන්ධව සියළු අලාභයන් ලියාහැරීම හෝ අලාභ සිදු වූ කාල පරිච්ඡේදය තුළ වියදමක් සේ හඳුනාගත යුතු වුවද, මණ්ඩලයේ හානි තොග ගිණුම් වල 2019 හා 2020 වසර වල රු.3,011,720ක් වූ තොග

හානි වටිනාකම පොත් වලින් ඉවත් කිරීම වෙනුවට හානි වූ තොග ලෙස ඉදිරියට ගෙන ඒම හේතුවෙන් 2020 වසරේ දී තොග වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු වත්කම් වලින් සියයට 9.2 ක් වූ රු 148,076,152 ක දෙවන ගුණත්වයේ තොගය තුල, හානි හා අළුත්වැඩියා කළ යුතු තොග, තොග සමීක්ෂණවලදී හඳුනාගෙන තිබූ තොග අතිරික්තතා ඌනතා, අලාභ හානි, විනාශ කළ යුතු භාණ්ඩ, කල් ඉකුත් වූ භාණ්ඩ වශයෙන් අවිනිශ්චිත ගිණුමකට මාරු කළ තොගද ඇතුළත් කර තිබුණි. 2021 දෙසැම්බර් 15 දින කටුබැද්ද පරිශ්‍රයේ ගබඩා භෞතිකව පරීක්ෂාවේ දී මෙම තොග වලින් ඇතැම් තොග නශ්‍යව පවතින බව හා අනෙක් තොග ඒවායේ පිරිවැයට වඩා අඩු විකුණුම් වටිනාකමක් නිරූපණය කරන බව අනාවරණය විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02හි 28 වගන්තිය ප්‍රකාරව ඒවායේ වටිනාකම ශුද්ධ උපලබ්ධි අගයට පෙන්නුම් කර නොතිබීම හේතුවෙන් අවසන් තොගය අධි තක්සේරු වී තිබුණි.

(ඇ) දැනට භාවිතයේ පවතින රු.29,112,880 ක් වූ මුළුමනින් ක්ෂය වූ පරිගණක ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව ප්‍රත්‍යාගණනයක් සිදු කර මූල්‍ය ප්‍රකාශ වලට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 හි 118 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය සතු අස්පෘශ්‍ය වත්කම් වෙනම හෙළිදරව් කළ යුතු අතර ඒවා ප්‍රයෝජනවත් ජීවිත කාලය පදනම් කරගෙන ක්‍රමක්ෂය කළ යුතු වුවත් මණ්ඩලය සතු රු.10,193,250 ක් වූ (2011 සිට 2013 දක්වා වියදම) SAP හා POS පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණ අතර පරිගණක හා දෘඩාංග යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 හි 17 වගන්තිය අනුව රජයේ ප්‍රදාන යටතේ මිලදී ගත් වත්කම් සඳහා වූ ක්‍රමක්ෂය අනුපාතය මණ්ඩලයේ අනෙකුත් වත්කම් ක්ෂය කරනු ලබන සමානුපාතයන්ට අනුව සිදුකර නොතිබුණ අතර 39 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය ප්‍රදාන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව සතුව තිබූ 1993 වර්ෂයේ දී අමාත්‍යාංශ අනුමැතියකින් මණ්ඩලයට පවරා දී තිබූ 1997 වර්ෂයේ රු.103,030,000කට තක්සේරු කර ඇති ඉඩම් කට්ටි 09ක වටිනාකම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ වල සටහන් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 හි 32 වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂයේ සිට ඉදිරියට එමින් පවතින අඩමාණ ණය වෙන්කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 හි 26 ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමේදී එය විලම්භීත ආදායම් ලෙස හඳුනාගත යුතු අතර අදාල වත්කම්වල ජීව කාලය පුරා එම අගය ක්‍රමක්ෂය කොට ආදායම් ප්‍රකාශය තුල ආදායම් යටතේ හඳුනාගත යුතුය. එසේ වුවත් මණ්ඩලය විසින් ක්‍රමක්ෂය රු 25,340,000 ක් ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. ඊට අදාල ක්‍රමක්ෂය වටිනාකමද වියදම් ලෙස ගිණුම් ගත නොකර වෙනස වූ රු 260,365 ක මුදල පමණක් වෙනත් මෙහෙයුම් වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(එ) මණ්ඩලයේ මාර්ගස්ථ තොග ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට 2014 වර්ෂයේ සිට ඉදිරියට එන රු.12,142,584 ක ශේෂයක් පැවතුණි. මාර්ගස්ථ තොග ශේෂය කාලීනව සසඳා නිරවුල් නොකිරීම හේතුවෙන් තත්‍ය ලෙස නොපවතින සාවද්‍ය තොග වටිනාකමක් ගිණුම් වල දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුල ලී බඩු උපකරණ හා වෙනත් උපකරණ යටතේ ගිණුම්ගත කළ යුතු රු.805,966ක් වූ වියදම් ගොඩනැගිලි සංවර්ධන වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඔ) ලංකා සළුසල ආයතනයට අයත් දේපළ ලක්සල ආයතනයට පවරා ගැනීම සඳහා රු.15,248,576ක මුදලක් 2012 වර්ෂයේ දී මණ්ඩලය විසින් ගෙවා තිබුණි. 2022 ජනවාරි දක්වා මෙම ඉඩමේ අයිතිය පවරාගෙන නොමැති බැවින් මෙම මුදල අත්තිකාරම් ලෙස ගිණුම් කැබිය යුතු වුවත් 2012 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඕ) 2021 දෙසැම්බර් 31 දිනට ණයගිමි ගිණුම තුල නිරවුල් නොකළ රු.4,004,034ක හර ශේෂ එකතුවක් පැවතීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මුළු ණයගිමි ශේෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ක) 2012 වර්ෂයේ සිට 2019 දක්වා රු.1,566,469ක් වූ කාර්යාල උපකරණ හා සේවා ගාස්තු සඳහා දරන ලද වියදම් පරිගණක හා දඩාංග යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ග) මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.43,987,327ක අනෙකුත් ගෙවිය යුතු වියදම් එකතු වටිනාකම සංනිරීක්ෂණය සඳහා උපලේඛන, කාල විශ්ලේෂණ හා ශේෂ තහවුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ව) 2012 වර්ෂයේ සිට ආරම්භක ශේෂයක් ලෙස නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට එමින් පවතින හඳුනා නොගත් රු.12,002,564ක රැඳවුම් මුදල් ශේෂය සනාථ කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ජ) 2011 වර්ෂයේ සිට ආරම්භක ශේෂයක් ලෙස ඉදිරියට එමින් පවතින ලැබිය යුතු කුලී තුල ඇතුලත් රු.1,113,557 ක වටිනාකම තහවුරු කිරීම සඳහා කිසිදු තොරතුරක් මණ්ඩලය සතුව නොතිබුණි.

(ට) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් රු81,078,806 ක් වූ ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තා වලින් තහවුරු කර නොතිබුණි.

(ඩ) උපචිත වියදම් තුල ඇතුලත් රු 6,546,541 ක් වූ වියදම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ත) රු.107,951,172 ක ප්‍රාග්ධන ප්‍රදාන ශේෂයක් වසර ගණනාවක සිට හිමිකම් යටතේ ඉදිරියට එමින් පවතින අතර එම ශේෂය ලියාහැරීම පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොතිබුණි. තවද එම ශේෂය තහවුරු කර ගැනීම සඳහා කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ද) SAP පද්ධතිය මඟින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම ආරම්භ වූ 2011 වර්ෂයේදී ගිණුම් 4 කට අදාලව රු.25,540,390 ක් වූ හර ශේෂ හා රු 30,805,565 ක් වූ බැර ශේෂ 6 ක් ආරම්භ ශේෂ වශයෙන් ගිණුම්ගත කර 2020 වර්ෂය දක්වාම ඉදිරියට ගෙනවිත් තිබුණි. මෙම ශේෂ වල නිවැරදිතාවය සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය. මෙම ශේෂ ඇතිවීමට බලපෑ හේතූන් පරීක්ෂා කර නිරවුල් කිරීමට මේ දක්වා පියවර ගෙන නොතිබුණි.

(න) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව එකතු තොග වටිනාකම රු.619,209,585 ක් වුවද භෞතික තොග සමීක්ෂණ වාර්තා ප්‍රකාරව තොග වටිනාකම් එකතුව රු.481,768,792 ක් වූයෙන් රු.137,440,793 ක වෙනසක් පැවතුණි.

(ප) මණ්ඩලයේ තොග පාලන ඒකකයේ වාර්තා ප්‍රකාරව හා ලෙජරය අනුව විශේෂ ඇණවුම් (Special Order) තොග ගිණුමේ ශේෂය රු.802,034 ක ඍණ ශේෂයක් ලෙස සටහන් වුවද අවසන් තොග සාරාංශ වාර්තාව ප්‍රකාරව භෞතික තොග වටිනාකම රු.1,090,325 ක ධන ශේෂයක් ලෙස දක්වා තිබුණි. නමුත් SAP පරිගණක පද්ධතිය අනුව කිසිදු ශේෂයක් දක්වා නොතිබූයෙන් භෞතික තොග ශේෂ හා ගිණුම් පද්ධති ශේෂය අතර රු.1,090,352 ක වෙනසක් නිරීක්ෂණය විය. මේ අනුව ආයතනය තුළ භෞතික වත්කම් ශේෂයන් හා පරිගණක පද්ධති ශේෂයන් වල පරස්පරතා හඳුනාගෙන සැසඳීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(බ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව දේපළ පිරියත හා උපකරණ ශේෂයෙහි 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය හා එදින සමීක්ෂණ වාර්තාව අනුව ශේෂයෙහි රු.132,842,084ක වෙනසක් නිරීක්ෂණය විය.

(ම) මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලය විසින් ගෙවිය යුතු මුළු හිඟ බදු වටිනාකම රු.54,827,612ක් වුවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ශේෂ තහවුරු ලිපිය අනුව ගෙවිය යුතු හිඟ මුළු බදු මුදල රු.56,370,397ක් වී තිබුණි. මෙම ශේෂය තුල රු.16,709,488ක අතිරේක දඩ මුදලක් හා රු.590,760ක අධිභාරයක්ද ඇතුලත්ව තිබුණි. ඒ අනුව ගෙවිය යුතු බදු මුදල රු.1,542,785ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අවදානම් ඇතිවීමේ හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හේතුවෙන් නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (උ) (ව)(ට)(න) (ම), 2.2.2(අ) සහ 3(ආ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2003.06.02 දිනැති අංක පීඊඩී/12 9.3.1 (vi) සහ (vii) වගන්ති	පුරප්පාඩු තනතුරු සඳහා අවිනිශ්චිත කාල පරිච්ඡේදයකට වැඩ බැලීමේ පත්වීම් ලබා නොදිය යුතු අතර, මාස තුනක උපරිම කාල පරිච්ඡේදයකට සීමා විය යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි දීර්ඝ කාල පරිච්ඡේද සඳහා නිලධාරීන් 11 දෙනෙකු සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි.
(ආ) ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.2 වගන්තිය	මණ්ඩලයේ ස්ථිර තනතුරු නොදරන කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන් තිදෙනෙකු සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබා දී තිබුණි.
(ඇ) 2018 සැප්තැම්බර් 27 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ DMS/1702/VO-1 II ලිපිය.	කාර්ය මණ්ඩලයේ තනතුරු 191 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණද ස්ථිර කාර්ය මණ්ඩලය අනුමත තනතුරු වලට අන්තර්ග්‍රහණය කිරීමට මෙම වාර්තාවේ දින වන විටත් මණ්ඩලයට නොහැකි වී තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් කරුණු

(අ) සැපයුම්කරුවන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත 2013 වර්ෂයේ දී මිලියන 200ක ණය මුදලක් ප්‍රදානය කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව වසරක් තුල මාසික වාරික ලෙස ගෙවීමටත් ණය මුදල මත සියයට 9 ක පොලී ප්‍රතිශතයක් ගෙවීමටත් නියමිතව තිබුණි. නියමිත පරිදි වාරික මුදල් හා පොලී නොගෙවීම හේතුවෙන් 2020 වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ණය මුදල රු.158,399,824ක් හා ගෙවිය යුතු පොලී ප්‍රමාණය රු.12,492,119ක් වී තිබුණි. පොලී මුදලින් රු.8,323,585ක අගයකට 2020 සැප්තැම්බර් 24 දින බැංකුව විසින් පමා සහන ණයක් (Moratorium Loan) සලසා දී තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත 2020 දෙසැම්බර් 31ට ගෙවිය යුතු පොලිය රු.4,168,534ක් සහ ණය මුදල රු.166,723,409ක් ව පවතින අතර ණය පොලී නොගෙවීම මත ප්‍රාග්ධනිත වූ රු.8,323,585ක ණය පොලියටද පොලී ගණනය වීමෙන් මණ්ඩලයට අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි

(ආ) මණ්ඩලයේ ගිණුම් තැබීම සහ තොග පාලනය සඳහා SAP නැමති මෘදුකාංගය භාවිතා කරන අතර, දෛනික විකුණුම් සඳහා POS නැමති මෘදුකාංගය භාවිතා කරයි. SAP නැමති මෘදුකාංගය මඟින් ආයතනයක මූල්‍ය කළමනාකරණය අලෙවි හා පාරිභෝගික කළමනාකරණය, තොග පාලනය, මිලදීගැනීම් පද්ධතිය, තොරතුරු විශ්ලේෂණය හා වාර්තාකරණය, මානව සම්පත් කළමනාකරණය වැනි සියළුම ක්ෂේත්‍ර සඳහා පහසුකම් සැපයුවද මණ්ඩලය විසින් මෙය භාවිතා කරන්නේ මූලික ගිණුම්කරණ කටයුතු සඳහා පමණි. ඒ අනුව රු. මිලියන 9 කට අධික පිරිවැයක් දරමින් වසර 10 ක් තිස්සේ මෙම පද්ධතිය ඌන උපයෝජනය වී තිබුණි. මණ්ඩලයේ මූල්‍ය පද්ධතියට දරාගත නොහැකි අධික නඩත්තු හා යාවත්කාලීන පිරිවැයක් සහිත පරිගණක පද්ධතියක් භාවිතා කිරීම හේතුවෙන් 2015 වර්ෂයෙන් පසුව මේ වන විටත් SAP මෘදුකාංගය යාවත්කාලීන කොට ඵලදායීව භාවිතා කිරීමට නොහැකිවී තිබුණි. මෙම මෘදුකාංග දීර්ඝ කාලයක සිට භාවිතා කළද, එම මෘදුකාංග වලට අදාළ මව් සමාගම් සමඟ සේවා ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. එසේ සේවා ගිවිසුම් යාවත්කාලීන නොකිරීම නිසා මෙම මෘදුකාංග වල නව සංස්කරණයන් (New Version) සහ වැඩිදියුණු කිරීම් අහිමි වී තිබුණි. ආයතනයේ දත්ත Back Up ලෙස තබාගෙන තිබුණද, හදිසි අවස්ථාවක එම දත්ත පද්ධතියට යළි ඇතුළත් කිරීමට නොහැකි වීම නිසා (Reinstallation) පද්ධතිය තුළ පවතින ආයතනයේ දත්ත සම්බන්ධව විශාල අවදානමක් පැවතුණි. POS නැමති මෘදුකාංගය සඳහා රු.1,193,250 ක් වැයකර ඇති අතර 2018 වර්ෂය

දක්වා පමණක් යාවත්කාලීන කර තිබුණි. මෙම මෘදුකාංගය මඟින් බාකෝඩ් හඳුනා ගැනීම, ලේබල් නිර්මාණය වැනි පහසුකම් ලබාගත හැකි වුවත් තොග තත්ත්වය හා විකුණුම් කටයුතු සඳහා පමණක් භාවිතා කර තිබුණි.

(ඇ) වර්ග අඩි 44,000 ක සිව් මහල් ගොඩනැගිල්ලක් වූ කොටුව ලක්සල ගොඩනැගිල්ල 2013 වර්ෂයේ දී නවීකරණය කිරීම සඳහා ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව ICTAD සුදුසුකම් නොමැති පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට පවරා ප්‍රසම්පාදන උපදෙස් නොසලකා රු.45,451.390ක් වැය කර තිබුණි. මේ පිළිබඳව ICTAD ආයතනය මඟින් ලබාදුන් වාර්තාව අනුව භෞතික වැඩ වටිනාකම අඩුකළ පසු කොන්ත්‍රාත්කරුගෙන් රු.මිලියන 30 ක මුදලක් මණ්ඩලයට ලැබිය යුතුව තිබුණි. එම ඉදිකිරීම් අතරමඟ නවතා තිබීම හේතුවෙන් උක්ත වර්ග අඩි 44,000 ක භූමි ප්‍රමාණයෙන් වර්ග අඩි 1,200 ක ප්‍රදර්ශනාගාර පවත්වාගෙන යන භූමි ප්‍රමාණය හැර සෙසු ප්‍රමාණය වසර 08කට ආසන්න කාලයක් පුරා භාවිතයට ගත නොහැකිව නිශ්කාර්යව පවතී. විශාල ආර්ථික වටිනාකමක් ඇති මෙම ගොඩනැගිල්ල නවීකරණ කටයුතු අතරමඟ නවතා දැමීම නිසා ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවති අතර, මණ්ඩලයට වාර්ෂිකව උපයාගත හැකිව තිබූ විශාල ආදායමක් අහිමිවී තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මෙම කොටුව ලක්සල ගොඩනැගිල්ල උකසට තබා 2012 – 2018 කාලය තුලදී ලබාගත් මිලියන 950ක ණය මුදල් වලට අදාළව රු.238,783,673ක මුදලක් පොලී වශයෙන් ලංකා බැංකුව වෙත ගෙවා තිබුණි. 2019 වර්ෂය අවසන් වන විට ශේෂව පැවති මිලියන 273ක් නව ණය මුදල් 03ක් ලෙස ප්‍රතිව්‍යුහගත කර තිබුණි. උක්ත ණය මුදල් වලට අදාළව වාරික ගෙවීම් සඳහා මාස 06ක අනුග්‍රාහක කාලයක් ලබා දී තිබුණු අතර එම කාල සීමාවද 2020 අප්‍රේල් මාසයෙන් අවසන්ව තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට ණය මුදල් වෙනුවෙන් ගෙවිය යුතු රු.28,076,000ක වාරික මුදල් සහ රු.21,828,756ක පොලී මුදල් විගණිත දින වූ 2021 දෙසැම්බර් 31 වන විටත් ගෙවීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ඉ) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට පවරා තිබූ වටිනාකම රු. 48,318,157 ක් වූ අක්කර 2 පර්චස් 21ක මොරටුව, කටුබැද්ද භූමියේ තිබෙන වර්ග අඩි 39,364 ක් වූ යුත් ගොඩනැගිලි පහෙන් ප්‍රදර්ශනාගාරය, රජයේ විගණන අංශය, මිලදී ගැනීම් අංශය හා ගබඩාව හැරුණු විට, ලක්සල වඩුකර්මාන්ත ශාලාව හා නේවාසිකාගාර පවතින ආසන්න වශයෙන් වර්ග අඩි 15,000ක ඉඩ ප්‍රමාණය හා වඩුකම්හල සතු වත්කම් 2012 වර්ෂයේ පමණ සිට නිශ්කාර්යව පවතී.

(ඊ) අමාත්‍ය මණ්ඩල තීරණ අංක 12/1523/553/020 හා 2012 ඔක්තෝබර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මඟින් ගාල්ල උණවටුන සීමාසහිත ලංකා සළුසල ශාඛාව පිහිටි අක්කර 01 හා පර්චස් 30.6 ක ඉඩම හා ගොඩනැගිලි ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත නිත්‍යානුකූල අයිතිය පැවරීමට අනුමැතිය ලැබී තිබුණි. ඒ වෙනුවෙන් ලංකා සළුසල ශාඛාවේ සේවය කරනු ලැබූ සේවකයින් 13 දෙනා ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම සඳහා අවශ්‍ය රු. 15,248,576 ක මුදල සළුසල ශාඛාව පිහිටි ඉඩම ගොඩනැගිල්ල මිලදී ගැනීමේ ගැනුම් ප්‍රතිඥාව ලෙස සලකා මණ්ඩලය විසින් 2012 දෙසැම්බර් 12 වන දින ගෙවා තිබුණි. උක්ත දේපළ සම්බන්ධයෙන් තවත් පාර්ශවයක් සළුසල ආයතනයට එරෙහිව නඩුවක් ගොනු කිරීම හේතුවෙන් ඉඩම මිලදී ගැනීම සඳහා මුදල් ගෙවා වසර 9 ක් ගතවී ඇතත් එකී ඉඩම මණ්ඩලය වෙත පවරා ගැනීමට නොහැකිවී තිබුණි.

(උ) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට භාණ්ඩ සපයන සැපයුම්කරුවන් වෙත ගෙවීම සඳහා 2014 වර්ෂයේදී ලංකා බැංකුව මඟින් ලබාදී තිබූ රු.150,000,000ක් වූ වක්‍රීය ණය පහසුකම 2019 ජූලි 03 රු.15,000,000 ක් දක්වා සීමා කර තිබුණි. මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු.18,384,206 ක ණය මුදල් වරින් වර ලබාගෙන තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ කෙටිකාලීන ණය ශේෂය රු.14,652,784 ක් විය. ලබාගත් ණය මුදල් වෙනුවෙන් ණය පොලී ලෙස 2020/21 වර්ෂ සඳහා රු.774,036 ක මුදලක් ගෙවා තිබුණු අතර ඒ තුළ ණය මුදල් ගෙවීම ප්‍රමාද වීම මත බැංකුව විසින් අයකළ රු.402,981ක දඩ පොලී සමඟ පොලී මුදල්ද ඇතුලත්ව තිබුණි.

(ඌ) 2019 මුල් අර්ධ වර්ෂයේ රු. 345,040,671 ක් ව පැවති මුළු අලෙවි ආදායම 2020 මුල් අර්ධ වර්ෂය අවසන් වන විට රු. 160,002,139 ක් වූ අතර එය පෙර වර්ෂය හා සසඳන විට සියයට 54 ක පහත වැටීමකි. මෙය 2021 මුල් අර්ධ වර්ෂය අවසානයේදී රු. 42,075,029 ක් දක්වා එනම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 74 කින් තවදුරටත් පහත බැස තිබුණි. කොවිඩ් වසංගත තත්ත්වය මත විදේශිකයින්ගේ නොපැමිණීම මීට ප්‍රධාන ලෙස බලපා ඇතත් දේශීය වෙළඳපල තුල නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා නව මිල කිරීමේ උපාය මාර්ගයන් අනුගමනය කොට දේශීය මට්ටමින් අලෙවිය ඉහළ නැංවීමට කළමනාකරණය පියවර ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් 2020 සහ 2021 වර්ෂ වලදී සේවක වැටුප් ඇතුළු අනෙකුත් වියදම් සඳහා රු. 65,771,252 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට සිදුවී තිබුණි.

(එ) මණ්ඩලය සතු අලෙවි ප්‍රදර්ශනාගාර පවත්වා ගෙන යාම වෙනුවෙන් රජයේ ගොඩනැගිලි සඳහා ගෙවිය යුතු බදු මුදල් නියමිත වේලාවට නොගෙවීම හේතුවෙන් ප්‍රදර්ශනාගාර 8 ක් සඳහා 2020 දෙසැම්බර් 31 දිනට රු.30,793,923 ක මුදලක් හිඟව පැවතුණි. තවද, බෞද්ධාලෝක මාවත ගොඩනැගිලි සඳහා රු10,372,983 ක මුදලක් වරිපනම් වශයෙන් කොළඹ මහ නගර සභාවට ගෙවා නොතිබුණි.

(ඒ) 1990 වර්ෂයේ පිහිටුවන ලද ශිල්පීන්ගේ සුභසාධන සංවර්ධන අරමුදලේ ව්‍යවස්ථා රෙගුලාසි ප්‍රකාරව ශිල්පීය සුභසාධනය වෙනුවෙන් Benevolent Fund නමින් පවත්වාගෙන ගිය අරමුදලේ 2020 දෙසැම්බර් 31 දක්වා රු.5,023,891 මුදලක් එකතු වී ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි. මෙම අරමුදල ශිල්ප සභාව වෙත පැවරීමට 2007 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණද මේ දක්වා එම පැවරීම නොකොට ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කර අරමුදලේ අභිමතාර්ථ ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවතුණි.

(ඔ) නිලධාරීන්ගෙන් අයකරන ලද සේවක ඇප මුදල් අදාල නිලධාරියා නමින් ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් නොකොට ඊට පටහැනිව රු.2,460,000 ක මුදලක් මණ්ඩලයේ ජංගම ගිණුමේ තැන්පත් කර අදාල නිලධාරියා වෙත ගෙවිය යුතු පොලී මුදල් මණ්ඩලය විසින් ගණනය කර ගෙවීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.1,097,804 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති